# ඇගයීම් වාර්තාව

## අ.පො.ස (සා.පෙළ) විභාගය - 2010

# 14 - කතෝලික ධර්මය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2010

## ඇගයීම් වාර්තාව

# 14 - කතෝලික ධර්මය

Curriculum
Assessment & Evaluation
Teaching Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

**සියලු ම හිමිකම් ඇවිරිණි.**

**කතෝලික ධර්මය**

ඇගයීම් වාර්තාව - අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2010

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ විභාග අතුරින් වැඩි ම අයදුම්කරුවන් සංඛ්‍යාවක් පෙනී සිටින්නේ අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහාය. ජාතික මට්ටමින් පවත්වන මෙම විභාගයේ ප්‍රතිඵල මත ලබාගන්නා සහතිකය, උසස් අධ්‍යාපනය සඳහා සුදුස්සන් තෝරා ගැනීමට පමණක් නොව මධ්‍යම  මට්ටමේ රැකියා අවස්ථා ලබාගැනීමට ද ජාතික මෙන් ම ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල සමහර පාඨමාලා හැදෑරීමට මූලික සුදුසුකමක් ලෙස ප්‍රයෝජනවත් මිනුම් දණ්ඩක් වශයෙන් ද පිළිගැනේ. මෙලෙස පිළිගැනෙන්නේ මෙම විභාගයේ ඇති වලංගුතාව හා විශ්වසනීයතාව මෙන් ම ඉහළ ගුණාත්මක බව ද හේතුවෙනි.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරුභවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එකසේ ප්‍රයෝජනවත්වනු නොඅනුමාන ය. මේ නිසා මෙය වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා පුස්තකාලයට යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව කොටස් තුනකින් යුක්ත වන අතර විෂය අභිමතාර්ථ සහ විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙහි I කොටසෙහි ඇතුළත් වේ. II වන කොටසෙහි පළමුවන හා දෙවන ප්‍රශ්න පත්‍ර සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටි, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනාවලින් සමන්විත වේ.

III වන කොටසෙහි, පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු හා ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව ඔබට මෙයින් යම් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

මෙම වාර්තාවේ ගුණාත්මකබව වැඩි දියුණුව සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස, ඉල්ලා සිටිමි. මෙම වාර්තාව සකස් කිරීම සඳහා කැප වූ ප්‍රධාන පරීක්ෂකවරුන්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ එම කාර්ය මණ්ඩලයටත්, මෙය මැනවින් මුද්‍රණය කර දුන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලාධිපතිතුමා ඇතුලු එම කාර්ය මණ්ඩලයේ සියලු ම දෙනාටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2012 ජනවාරි 20
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර මයා<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර මිය<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය හා සංස්කරණය** | : | එල්.ජී.එස්. සමරකෝන් මයා<br>සහකාර විභාග කොමසාරිස් |
| **සැකසුම් කමිටුව** | : | ඩී. අයි. ජෝශප් මෙනවිය<br>ගුරු උපදේශිකා<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>කොළඹ |
| | | එච්. මියුරියල් ප්‍රනාන්දු මිය<br>බප/මීග/බැසිලිකා ම.වි.<br>රාගම |
| | | අයි. ඊ. පී. ප්‍රනාන්දු මිය<br>ව/හලා/වෙන්/ගෝනවිල සා. ජෝසප් වි.<br>දංකොටුව |
| **පරිගණක පිටපත සැකසුම** | : | ඩබ්.ඒ.ඩී. චතුරිකා දිසානායක මෙනවිය<br>පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු |

# ඇතුළත පිටු

පිටු අංකය

**I කොටස**

1. **විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු**

1.1 **විෂය අභිමතාර්ථ** 1

1.2 **විෂය සාධනය පිළිබඳ තොරතුරු**

1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3. පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4. පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව 4
1.2.5. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 7

1.3 **විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය**

1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 8
1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 9
1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 9
1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 10

**II කොටස**

2. **ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.1 **I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.1.1. I ප්‍රශ්න පත්‍රයේ - ව්‍යුහය 11
2.1.2. I ප්‍රශ්න පත්‍රය 12
2.1.3. I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 16
2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන 17

2.2 **II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.2.1. II ප්‍රශ්න පත්‍රයේ - ව්‍යුහය 18
2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය සහ නිරීක්ෂණ හා නිගමන 19

**III කොටස**

3. **පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා**

3.1 **පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු** 28

3.2 **ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා** 29

## I කොටස

## 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 විෂය අභිමතාර්ථ

- ★ මැවිල්ලේ උතුම්ම මැවිල්ල වන මනුෂ්‍යයා හට තම මැවුම්කරුවාණන් හඳුනාගෙන මැවිල්ල දෙවියන් වහන්සේගෙන් ලද තිළිණයක් සේ සලකා එය සුරැකීමට හා සංවර්ධනය කිරීමට හැකියාව හා දැනුම වර්ධනය කිරීම.
- ★ ක්‍රිස්තුස් වහන්සේගේ දූත කාර්ය හා උත්ථානයේ අත්දැකීම පිළිගෙන පරිණත කිතුනු ජීවිතයක් ගත කිරීමට සැලැස්වීම.
- ★ දේව වචනය, ප්‍රසාද නිධාන හා ජන වන්දනාව තුළින් පෝෂණය ලබා කිතුනුවෙකු ලෙස සමාජය තුළ සාක්ෂි දැරීමට සැලැස්වීම.
- ★ මූලික කිතුනු සදාචාරය ගොඩ නංවන දේව පනත් හා මහා මංගල දේශනය තුළින් ධර්මය ඉගෙනීම හා ජීවත්වීම එකම ක්‍රියාවලියක් බව අවබෝධ කිරීම.
- ★ යාච්ඤාවේ බලයෙන් ශක්තිමත් වී සමාජය ආලෝකවත් කරන ආලෝකයක් සේ ක්‍රියා කිරීමට මග පෙන්වීම.
- ★ ක්‍රිස්තුස් වහන්සේගේ අසීමිත, කොන්දේසි විරහිත ප්‍රේමයෙහි වර්ධනය වී එම ප්‍රේමය සමාජය තුළ පතුරුවාලීමට සැලසීම.
- ★ තම අවට ස්වභාවික පරිසරය දෙවියන් වහන්සේගෙන් ලද තිළිණයක් සේ සලකා එය සුරැකීමටත්, සංවර්ධනය කිරීමටත් අවශ්‍ය හැකියාව හා දැනුම වර්ධනය කිරීම.
- ★ සාරධර්ම සුරකිමින් මානව සබඳතා ගොඩනඟන අතර, කිතුනු අනන්‍යතාව තුළ සහජීවනයෙන් යුතු සමාජයක් බිහි කරලීමට දායක කරවීම.
- ★ කිතුනු විශ්වාසය රැකගන්නා අතරම සෑම ආගමකට ම ගරු කිරීමට පුරුදු කරවීම.
- ★ ශ්‍රී ලාංකික පුරවැසියෙකු වශයෙන් තම රට කෙරෙහි ආදරයක් හා ගෞරවයක් ජනිත කරවීම

## 1.2 විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 13,876 | 262 | 14,138 |
| දෙමළ | 5,781 | 551 | 6,332 |
| ඉංග්‍රීසි | 48 | 122 | 170 |
| එකතුව | **19,705** | **935** | **20,640** |

වගුව 1

### 1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 8,991 | 45.63 | 144 | 15.40 | 9,135 | 44.26 |
| B | 3,172 | 16.10 | 194 | 20.75 | 3,366 | 16.31 |
| C | 3,843 | 19.50 | 308 | 32.94 | 4,151 | 20.11 |
| S | 2,608 | 13.24 | 218 | 23.32 | 2,826 | 13.69 |
| W | 1,091 | 5.54 | 71 | 7.59 | 1,162 | 5.63 |
| එකතුව | **19,705** | **100.00** | **935** | **100.00** | **20,640** | **100.00** |

වගුව 2

1.2.3. පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 3126 | 1811 | 57.93 | 416 | 13.31 | 483 | 15.45 | 265 | 8.48 | 2975 | 95.17 | 151 | 4.83 |
| 2. ගම්පහ | 5503 | 2652 | 48.19 | 754 | 13.70 | 1000 | 18.17 | 730 | 13.27 | 5136 | 93.33 | 367 | 6.67 |
| 3. කළුතර | 498 | 270 | 54.22 | 63 | 12.65 | 78 | 15.66 | 52 | 10.44 | 463 | 92.97 | 35 | 7.03 |
| 4. මහනුවර | 339 | 174 | 51.33 | 43 | 12.68 | 58 | 17.11 | 51 | 15.04 | 326 | 96.17 | 13 | 3.83 |
| 5. මාතලේ | 118 | 59 | 50.00 | 14 | 11.86 | 26 | 22.03 | 17 | 14.41 | 116 | 98.31 | 2 | 1.69 |
| 6. නුවරඑළිය | 519 | 89 | 17.15 | 91 | 17.53 | 158 | 30.44 | 129 | 24.86 | 467 | 89.98 | 52 | 10.02 |
| 7. ගාල්ල | 61 | 35 | 57.38 | 12 | 19.67 | 8 | 13.11 | 6 | 9.84 | 61 | 100.00 | 0 | 0.00 |
| 8. මාතර | 40 | 10 | 25.00 | 5 | 12.50 | 15 | 37.50 | 10 | 25.00 | 40 | 100.00 | 0 | 0.00 |
| 9. හම්බන්තොට | 3 | 1 | 33.33 | 0 | 0.00 | 1 | 33.33 | 1 | 33.33 | 3 | 100.00 | 0 | 0.00 |
| 10. යාපනය | 1173 | 486 | 41.43 | 214 | 18.24 | 246 | 20.97 | 160 | 13.64 | 1106 | 94.29 | 67 | 5.71 |
| 11. කිලිනොච්චි | 242 | 51 | 21.07 | 48 | 19.83 | 61 | 25.21 | 49 | 20.25 | 209 | 86.36 | 33 | 13.64 |
| 12. මන්නාරම | 814 | 410 | 50.37 | 160 | 19.66 | 152 | 18.67 | 79 | 9.71 | 801 | 98.40 | 13 | 1.60 |
| 13. වව්නියාව | 328 | 158 | 48.17 | 66 | 20.12 | 65 | 19.82 | 29 | 8.84 | 318 | 96.95 | 10 | 3.05 |
| 14. මුලතිව් | 216 | 70 | 32.41 | 25 | 11.57 | 48 | 22.22 | 46 | 21.30 | 189 | 87.50 | 27 | 12.50 |
| 15. මඩකලපුව | 320 | 135 | 42.19 | 47 | 14.69 | 59 | 18.44 | 45 | 14.06 | 286 | 89.38 | 34 | 10.63 |
| 16. අම්පාර | 106 | 43 | 40.57 | 21 | 19.81 | 26 | 24.53 | 9 | 8.49 | 99 | 93.40 | 7 | 6.60 |
| 17. ත්‍රිකුණාමලය | 206 | 89 | 43.20 | 33 | 16.02 | 48 | 23.30 | 21 | 10.19 | 191 | 92.72 | 15 | 7.28 |
| 18. කුරුණෑගල | 583 | 289 | 49.57 | 103 | 17.67 | 94 | 16.12 | 73 | 12.52 | 559 | 95.88 | 24 | 4.12 |
| 19. පුත්තලම | 3147 | 1510 | 47.98 | 533 | 16.94 | 532 | 16.90 | 421 | 13.38 | 2996 | 95.20 | 151 | 4.80 |
| 20. අනුරාධපුරය | 92 | 41 | 44.57 | 17 | 18.48 | 20 | 21.74 | 9 | 9.78 | 87 | 94.57 | 5 | 5.43 |
| 21. පොළොන්නරුව | 37 | 25 | 67.57 | 2 | 5.41 | 4 | 10.81 | 3 | 8.11 | 34 | 91.89 | 3 | 8.11 |
| 22. බදුල්ල | 193 | 66 | 34.20 | 29 | 15.03 | 51 | 26.42 | 32 | 16.58 | 178 | 92.23 | 15 | 7.77 |
| 23. මොනරාගල | 14 | 5 | 35.71 | 2 | 14.29 | 1 | 7.14 | 5 | 35.71 | 13 | 92.86 | 1 | 7.14 |
| 24. රත්නපුරය | 114 | 42 | 36.84 | 24 | 21.05 | 25 | 21.93 | 18 | 15.79 | 109 | 95.61 | 5 | 4.39 |
| 25. කෑගල්ල | 100 | 43 | 43.00 | 13 | 13.00 | 16 | 16.00 | 18 | 18.00 | 90 | 90.00 | 10 | 10.00 |
| **සමස්ත දිවයින** | **17892** | **8564** | **47.86** | **2735** | **15.29** | **3275** | **18.30** | **2278** | **12.73** | **16852** | **94.19** | **1040** | **5.81** |

වගුව 3

## 1.2.4. පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 2220 | 1319 | 59.41 | 303 | 13.65 | 340 | 15.32 | 160 | 7.21 | 2122 | 95.59 | 98 | 4.41 |
| 2. හෝමාගම | 99 | 43 | 43.43 | 12 | 12.12 | 17 | 17.17 | 17 | 17.17 | 89 | 89.90 | 10 | 10.10 |
| 3. ශ්‍රී ජයවර්ධනපුර | 146 | 53 | 36.30 | 27 | 18.49 | 27 | 18.49 | 31 | 21.23 | 138 | 94.52 | 8 | 5.48 |
| 4. පිළියන්දල | 661 | 396 | 59.91 | 74 | 11.20 | 99 | 14.98 | 57 | 8.62 | 626 | 94.70 | 35 | 5.30 |
| 5. ගම්පහ | 394 | 247 | 62.69 | 45 | 11.42 | 48 | 12.18 | 39 | 9.90 | 379 | 96.19 | 15 | 3.81 |
| 6 මිනුවන්ගොඩ | 251 | 85 | 33.86 | 40 | 15.94 | 49 | 19.52 | 51 | 20.32 | 225 | 89.64 | 26 | 10.36 |
| 7. මීගමුව | 3945 | 1936 | 49.07 | 549 | 13.92 | 717 | 18.17 | 507 | 12.85 | 3709 | 94.02 | 236 | 5.98 |
| 8. කැලණිය | 913 | 384 | 42.06 | 120 | 13.14 | 186 | 20.37 | 133 | 14.57 | 823 | 90.14 | 90 | 9.86 |
| 9. කළුතර | 475 | 264 | 55.58 | 58 | 12.21 | 73 | 15.37 | 49 | 10.32 | 444 | 93.47 | 31 | 6.53 |
| 10. මතුගම | 14 | 4 | 28.57 | 2 | 14.29 | 4 | 28.57 | 1 | 7.14 | 11 | 78.57 | 3 | 21.43 |
| 11. හොරණ | 9 | 2 | 22.22 | 3 | 33.33 | 1 | 11.11 | 2 | 22.22 | 8 | 88.89 | 1 | 11.11 |
| 12. නුවර | 230 | 142 | 61.74 | 30 | 13.04 | 32 | 13.91 | 20 | 8.70 | 224 | 97.39 | 6 | 2.61 |
| 13. දෙනුවර | 6 | 2 | 33.33 | 0 | 0.00 | 1 | 16.67 | 3 | 50.00 | 6 | 100.00 | 0 | 0.00 |
| 14. ගම්පොල | 59 | 22 | 37.29 | 7 | 11.86 | 13 | 22.03 | 13 | 22.03 | 55 | 93.22 | 4 | 6.78 |
| 15. තෙල්දෙනිය | 13 | 1 | 7.69 | 3 | 23.08 | 5 | 38.46 | 3 | 23.08 | 12 | 92.31 | 1 | 7.69 |
| 16. වත්තේගම | 28 | 7 | 25.00 | 3 | 10.71 | 6 | 21.43 | 10 | 35.71 | 26 | 92.86 | 2 | 7.14 |
| 17. කටුගස්තොට | 3 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 33.33 | 2 | 66.67 | 3 | 100.00 | 0 | 0.00 |
| 18. මාතලේ | 67 | 31 | 46.27 | 10 | 14.93 | 11 | 16.42 | 14 | 20.90 | 66 | 98.51 | 1 | 1.49 |
| 19. ගලේවෙල | 50 | 28 | 56.00 | 4 | 8.00 | 14 | 28.00 | 3 | 6.00 | 49 | 98.00 | 1 | 2.00 |
| 20. නාඋල | 1 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100.00 | 0 | 0.00 | 1 | 100.00 | 0 | 0.00 |
| 21. විල්ගමුව | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 22. නුවරඑළිය | 245 | 44 | 17.96 | 48 | 19.59 | 75 | 30.61 | 56 | 22.86 | 223 | 91.02 | 22 | 8.98 |
| 23. කොත්මලේ | 28 | 4 | 14.29 | 6 | 21.43 | 9 | 32.14 | 7 | 25.00 | 26 | 92.86 | 2 | 7.14 |
| 24. හැටන් | 207 | 34 | 16.43 | 31 | 14.98 | 60 | 28.99 | 56 | 27.05 | 181 | 87.44 | 26 | 12.56 |
| 25. වලපනේ | 36 | 7 | 19.44 | 6 | 16.67 | 12 | 33.33 | 9 | 25.00 | 34 | 94.44 | 2 | 5.56 |
| 26. හඟුරන්කෙත | 3 | 0 | 0.00 | 0 | 0.00 | 2 | 66.67 | 1 | 33.33 | 3 | 100.00 | 0 | 0.00 |
| 27. ගාල්ල | 45 | 30 | 66.67 | 9 | 20.00 | 5 | 11.11 | 1 | 2.22 | 45 | 100.00 | 0 | 0.00 |
| 28. ඇල්පිටිය | 7 | 2 | 28.57 | 2 | 28.57 | 1 | 14.29 | 2 | 28.57 | 7 | 100.00 | 0 | 0.00 |
| 29. අම්බලන්ගොඩ | 2 | 1 | 50.00 | 0 | 0.00 | 1 | 50.00 | 0 | 0.00 | 2 | 100.00 | 0 | 0.00 |
| 30. උඩුගම | 7 | 2 | 28.57 | 1 | 14.29 | 1 | 14.29 | 3 | 42.86 | 7 | 100.00 | 0 | 0.00 |
| 31. මාතර | 14 | 7 | 50.00 | 2 | 14.29 | 3 | 21.43 | 2 | 14.29 | 14 | 100.00 | 0 | 0.00 |
| 32. අකුරැස්ස | 1 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100.00 | 1 | 100.00 | 0 | 0.00 |
| 33. මුලටියන-හක්මණ | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 34. මොරවක-දෙනියාය | 25 | 3 | 12.00 | 3 | 12.00 | 12 | 48.00 | 7 | 28.00 | 25 | 100.00 | 0 | 0.00 |
| 35. තංගල්ල | 1 | 1 | 100.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100.00 | 0 | 0.00 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 36. හම්බන්තොට | 2 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 50.00 | 1 | 50.00 | 2 | 100.00 | 0 | 0.00 |
| 37. වලස්මුල්ල | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 38. යාපනය | 573 | 280 | 48.87 | 97 | 16.93 | 105 | 18.32 | 68 | 11.87 | 550 | 95.99 | 23 | 4.01 |
| 39. දූපත | 161 | 48 | 29.81 | 40 | 24.84 | 48 | 29.81 | 20 | 12.42 | 156 | 96.89 | 5 | 3.11 |
| 40. තෙන්මාරච්චි | 34 | 7 | 20.59 | 4 | 11.76 | 9 | 26.47 | 6 | 17.65 | 26 | 76.47 | 8 | 23.53 |
| 41. වලිකාමන් | 253 | 99 | 39.13 | 46 | 18.18 | 53 | 20.95 | 43 | 17.00 | 241 | 95.26 | 12 | 4.74 |
| 42. වඩමරච්චි | 152 | 52 | 34.21 | 27 | 17.76 | 31 | 20.39 | 23 | 15.13 | 133 | 87.50 | 19 | 12.50 |
| 43. කිලිනොච්චි | 242 | 51 | 21.07 | 48 | 19.83 | 61 | 25.21 | 49 | 20.25 | 209 | 86.36 | 33 | 13.64 |
| 44. මන්නාරම | 677 | 382 | 56.43 | 130 | 19.20 | 120 | 17.73 | 42 | 6.20 | 674 | 99.56 | 3 | 0.44 |
| 45. මඩු | 137 | 28 | 20.44 | 30 | 21.90 | 32 | 23.36 | 37 | 27.01 | 127 | 92.70 | 10 | 7.30 |
| 46. වව්නියාව | 281 | 149 | 53.02 | 59 | 21.00 | 45 | 16.01 | 24 | 8.54 | 277 | 98.58 | 4 | 1.42 |
| 47. වව්නියාව උතුර | 47 | 9 | 19.15 | 7 | 14.89 | 20 | 42.55 | 5 | 10.64 | 41 | 87.23 | 6 | 12.77 |
| 48. මුලතිව් | 184 | 65 | 35.33 | 22 | 11.96 | 37 | 20.11 | 35 | 19.02 | 159 | 86.41 | 25 | 13.59 |
| 49. තුනුක්කායි | 32 | 5 | 15.63 | 3 | 9.38 | 11 | 34.38 | 11 | 34.38 | 30 | 93.75 | 2 | 6.25 |
| 50. මඩකලපුව | 283 | 126 | 44.52 | 43 | 15.19 | 50 | 17.67 | 38 | 13.43 | 257 | 90.81 | 26 | 9.19 |
| 51. කල්කුඩා | 23 | 1 | 4.35 | 3 | 13.04 | 8 | 34.78 | 4 | 17.39 | 16 | 69.57 | 7 | 30.43 |
| 52. පදිරිප්පු | 14 | 8 | 57.14 | 1 | 7.14 | 1 | 7.14 | 3 | 21.43 | 13 | 92.86 | 1 | 7.14 |
| 53. මඩකලපුව (මධ්‍යම) | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 54. අම්පාර | 18 | 5 | 27.78 | 3 | 16.67 | 2 | 11.11 | 5 | 27.78 | 15 | 83.33 | 3 | 16.67 |
| 55. කල්මුනේ | 34 | 21 | 61.76 | 5 | 14.71 | 5 | 14.71 | 1 | 2.94 | 32 | 94.12 | 2 | 5.88 |
| 56. සමන්තුරෙයි | 36 | 11 | 30.56 | 9 | 25.00 | 11 | 30.56 | 3 | 8.33 | 34 | 94.44 | 2 | 5.56 |
| 57. මහඔය | 1 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100.00 | 0 | 0.00 | 1 | 100.00 | 0 | 0.00 |
| 58. දෙහිඅත්තකන්ඩිය | 1 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100.00 | 0 | 0.00 | 1 | 100.00 | 0 | 0.00 |
| 59. අක්කරෙයිපත්තුව | 16 | 6 | 37.50 | 4 | 25.00 | 6 | 37.50 | 0 | 0.00 | 16 | 100.00 | 0 | 0.00 |
| 60. ත්‍රිකුණාමලය | 163 | 74 | 45.40 | 27 | 16.56 | 37 | 22.70 | 15 | 9.20 | 153 | 93.87 | 10 | 6.13 |
| 61. මුතූර් | 15 | 3 | 20.00 | 1 | 6.67 | 6 | 40.00 | 2 | 13.33 | 12 | 80.00 | 3 | 20.00 |
| 62. කන්තලේ | 5 | 4 | 80.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 4 | 80.00 | 1 | 20.00 |
| 63. කින්නියා | 23 | 8 | 34.78 | 5 | 21.74 | 5 | 21.74 | 4 | 17.39 | 22 | 95.65 | 1 | 4.35 |
| 64. කුරුණෑගල | 157 | 88 | 56.05 | 26 | 16.56 | 24 | 15.29 | 12 | 7.64 | 150 | 95.54 | 7 | 4.46 |
| 65. කුලියාපිටිය | 289 | 145 | 50.17 | 45 | 15.57 | 53 | 18.34 | 38 | 13.15 | 281 | 97.23 | 8 | 2.77 |
| 66. නිකවැරටිය | 32 | 10 | 31.25 | 11 | 34.38 | 3 | 9.38 | 6 | 18.75 | 30 | 93.75 | 2 | 6.25 |
| 67. මහව | 16 | 3 | 18.75 | 3 | 18.75 | 4 | 25.00 | 3 | 18.75 | 13 | 81.25 | 3 | 18.75 |
| 68. ගිරිඋල්ල | 87 | 43 | 49.43 | 17 | 19.54 | 10 | 11.49 | 14 | 16.09 | 84 | 96.55 | 3 | 3.45 |
| 69. ඉබ්බාගමුව | 2 | 0 | 0.00 | 1 | 50.00 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 50.00 | 1 | 50.00 |
| 70. පුත්තලම | 732 | 295 | 40.30 | 139 | 18.99 | 150 | 20.49 | 112 | 15.30 | 696 | 95.08 | 36 | 4.92 |
| 71. හලාවත | 2415 | 1215 | 50.31 | 394 | 16.31 | 382 | 15.82 | 309 | 12.80 | 2300 | 95.24 | 115 | 4.76 |
| 72. අනුරාධපුරය | 37 | 20 | 54.05 | 6 | 16.22 | 7 | 18.92 | 1 | 2.70 | 34 | 91.89 | 3 | 8.11 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 73. තඹුත්තේගම | 13 | 6 | 46.15 | 3 | 23.08 | 2 | 15.38 | 2 | 15.38 | 13 | 100.00 | 0 | 0.00 |
| 74. කැකිරාව | 26 | 11 | 42.31 | 4 | 15.38 | 8 | 30.77 | 2 | 7.69 | 25 | 96.15 | 1 | 3.85 |
| 75. ගලෙන්බිඳුනුවැව | 5 | 2 | 40.00 | 3 | 60.00 | 0 | 0.00 | 0 | 0.00 | 5 | 100.00 | 0 | 0.00 |
| 76. කැබිතිගොල්ලෑව | 11 | 2 | 18.18 | 1 | 9.09 | 3 | 27.27 | 4 | 36.36 | 10 | 90.91 | 1 | 9.09 |
| 77. පොළොන්නරුව | 21 | 14 | 66.67 | 2 | 9.52 | 3 | 14.29 | 2 | 9.52 | 21 | 100.00 | 0 | 0.00 |
| 78. හිඟුරක්ගොඩ | 15 | 11 | 73.33 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 6.67 | 12 | 80.00 | 3 | 20.00 |
| 79. දිඹුලාගල | 1 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100.00 | 0 | 0.00 | 1 | 100.00 | 0 | 0.00 |
| 80. බදුල්ල | 43 | 15 | 34.88 | 5 | 11.63 | 13 | 30.23 | 4 | 9.30 | 37 | 86.05 | 6 | 13.95 |
| 81. බණ්ඩාරවෙල | 98 | 38 | 38.78 | 16 | 16.33 | 24 | 24.49 | 14 | 14.29 | 92 | 93.88 | 6 | 6.12 |
| 82. මහියංගනය | 4 | 1 | 25.00 | 0 | 0.00 | 1 | 25.00 | 2 | 50.00 | 4 | 100.00 | 0 | 0.00 |
| 83. වැලිමඩ | 8 | 1 | 12.50 | 0 | 0.00 | 4 | 50.00 | 3 | 37.50 | 8 | 100.00 | 0 | 0.00 |
| 84. පස්සර | 40 | 11 | 27.50 | 8 | 20.00 | 9 | 22.50 | 9 | 22.50 | 37 | 92.50 | 3 | 7.50 |
| 85. මොණරාගල | 6 | 1 | 16.67 | 1 | 16.67 | 1 | 16.67 | 3 | 50.00 | 6 | 100.00 | 0 | 0.00 |
| 86. වැල්ලවාය | 3 | 1 | 33.33 | 0 | 0.00 | 0 | 0.00 | 2 | 66.67 | 3 | 100.00 | 0 | 0.00 |
| 87. බිබිල | 5 | 3 | 60.00 | 1 | 20.00 | 0 | 0.00 | 0 | 0.00 | 4 | 80.00 | 1 | 20.00 |
| 88. රත්නපුර | 44 | 14 | 31.82 | 9 | 20.45 | 12 | 27.27 | 9 | 20.45 | 44 | 100.00 | 0 | 0.00 |
| 89. බළන්ගොඩ | 38 | 16 | 42.11 | 6 | 15.79 | 9 | 23.68 | 5 | 13.16 | 36 | 94.74 | 2 | 5.26 |
| 90. නිවිතිගල | 10 | 0 | 0.00 | 3 | 30.00 | 2 | 20.00 | 4 | 40.00 | 9 | 90.00 | 1 | 10.00 |
| 91. ඇඹිලිපිටිය | 22 | 12 | 54.55 | 6 | 27.27 | 2 | 9.09 | 0 | 0.00 | 20 | 90.91 | 2 | 9.09 |
| 92. කෑගල්ල | 37 | 24 | 64.86 | 3 | 8.11 | 5 | 13.51 | 2 | 5.41 | 34 | 91.89 | 3 | 8.11 |
| 93. මාවනැල්ල | 13 | 4 | 30.77 | 4 | 30.77 | 2 | 15.38 | 3 | 23.08 | 13 | 100.00 | 0 | 0.00 |
| 94. දෙහිඕවිට | 50 | 15 | 30.00 | 6 | 12.00 | 9 | 18.00 | 13 | 26.00 | 43 | 86.00 | 7 | 14.00 |
| **සමස්ත දිවයින** | **17892** | **8564** | **47.86** | **2735** | **15.29** | **3275** | **18.30** | **2278** | **12.73** | **16852** | **94.18** | **1040** | **5.81** |

වගුව 4

1.2.5. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව


| පන්ති ප්‍රාන්තර | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්ත සංඛ්‍යාතය | සමුච්ත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 1476 | 7.15 | 20640 | 100.00 |
| 81 - 90 | 4084 | 19.79 | 19164 | 92.85 |
| 71 - 80 | 4027 | 19.51 | 15080 | 73.06 |
| 61 - 70 | 3510 | 17.01 | 11053 | 53.55 |
| 51 - 60 | 2970 | 14.39 | 7543 | 36.55 |
| 41 - 50 | 2050 | 9.93 | 4573 | 22.16 |
| 31 - 40 | 1434 | 6.95 | 2523 | 12.22 |
| 21 - 30 | 680 | 3.29 | 1089 | 5.28 |
| 11 - 20 | 342 | 1.66 | 409 | 1.98 |
| 01 - 10 | 66 | 0.32 | 67 | 0.32 |
| 00 - 00 | 1 | 0 | 1 | 0.00 |

වගුව 5

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.
උදා:- (71 - 80 අතර පන්ති ප්‍රාන්තරය ගතහොත්)
මෙම විෂයය සඳහා ලකුණු 71 - 80 අතර ලකුණු ලබාගත් සංඛ්‍යාව 4027 කි. එය ප්‍රතිශතයක් වශයෙන් 19.51%කි. ලකුණු 40ක් හෝ ඊට අඩුවෙන් ලකුණු ලබා ඇති සංඛ්‍යාව 2523ක් වන අතර, එය ප්‍රතිශතයක් වශයෙන් 12.22%කි.

## 1.3. විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය





ප්‍රස්තාරය 1 (RD/16/05/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- ඉහත ප්‍රස්තාරයට අනුව, 27 වන ප්‍රශ්නයට නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 93%ක් පමණ වන අතර, එය සිසුන් වඩාත් හොඳින් පිළිතුරු සැපයූ පහසුම ප්‍රශ්න ලෙස දැක්විය හැකිය. 4වන ප්‍රශ්නයට නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ 25%ක් පමණ වේ. ඒ අනුව පහසුතාව අඩු ම ප්‍රශ්නය වශයෙන් 4වන ප්‍රශ්නය දැක්විය හැකි ය.

### 1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- ප්‍රශ්න තෝරා ගැනීමේ දී පිළිතුරු සැපයීම සඳහා 2වන ප්‍රශ්නය 67%ක් පමණ තෝරාගෙන ඇති අතර 73%ක් පමණ 3වන ප්‍රශ්නය තෝරාගෙන ඇත.

ප්‍රස්තාරය 2 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

### 1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :- මෙහි 1වන ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 20කි. මෙම ප්‍රස්තාරයට අනුව එම මුළු ලකුණුවලින්, ලකුණු 0%-25% අතර එනම් ලකුණු 0 -5ත් අතර ලබාගත් අයදුම්කරුවන් ප්‍රතිශතය 14%ක් පමණ වේ. මුළු ලකුණුවලින්, ලකුණු 26%-50% අතර එනම් ලකුණු 6 - 10ත් අතර ලබාගත් අයදුම්කරුවන් ප්‍රතිශතය 23%ක් පමණ වේ. මුළු ලකුණුවලින්, ලකුණු 51%-75% අතර එනම් ලකුණු 11 - 15ත් අතර ලබාගත් අයදුම්කරුවන් ප්‍රතිශතය 33%ක් පමණ වේ. මුළු ලකුණුවලින්, ලකුණු 76%-100% අතර එනම් ලකුණු 16 - 20ත් අතර ලබා ගත් අයදුම්කරුවන් ප්‍රතිශතය 29%ක් පමණ වේ.

ප්‍රස්තාරය 3 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

## 1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 4 (RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- 2වන ප්‍රශ්නයේ එක් එක් කොටස සඳහා සාර්ථකව පිළිතුරු සැපයූ ප්‍රතිශතය (i) කොටස සඳහා 76%ක් පමණ ද, (ii) කොටස සඳහා 76%ක් පමණ ද, (iii) කොටස සඳහා 88%ක් පමණ ද වේ.

# II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

- කාලය පැය 01කි. මුළු ලකුණු 40කි.
- බහුවරණ ප්‍රශ්න 40 කි. සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.
- ප්‍රශ්න අංක 1 - 40 දක්වා ප්‍රශ්නවලට සපයා ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තේරීම බලාපොරොත්තු වේ.

## 2.1.2 I ප්‍රශ්න පත්‍රය

1. "දෙවියන් වහන්සේ ලෝකය මවා එය මනහර බව දුටු සේක" යනුවෙන් අදහස් කරනුයේ,
   (1) දෙවිඳුන්ගේ ආශිර්වාදය හා කැමැත්ත අනුව ලෝකය නිර්මාණය වූ බව ය.
   (2) දෙවියන් වහන්සේ මැවූ ලෝකය ඉතා වටිනා සම්පතක් බව ය.
   (3) ලෝකය සම්පත්වලින් පුරවා එය ආශිර්වාද කළ බව ය.
   (4) දෙවියන් වහන්සේ තම කැමැත්ත පරිදි සියලු මැවිලි ඇති වීමට සැලසූ බව ය.

2. උත්පත්ති පොතේ සඳහන් වන දේදුන්නේ සළකුණට පසුබිම වූයේ දෙවියන් වහන්සේ .................. සමග ඇති කරගත් ගිවිසුම ය. හිස්තැනට යෝග්‍යය වචනය වනුයේ
   (1) ආබ්‍රහම්  (2) නෝවා  (3) මෝසෙස්  (4) ජාකොබ්

3. ජේසුස් වහන්සේගේ උපත අපට සුභාරංචියක් වනුයේ උන්වහන්සේ,
   (1) දෙවියන් වහන්සේ වෙතින් පැමිණි තැනැත්තෙක් වූ නිසා ය.
   (2) පැරණි ගිවිසුමේ දිවැස් වැකි සම්පූර්ණ කළ නිසා ය.
   (3) ලෝකයට ගැලවීම ගෙන දුන් නිසා ය.
   (4) දවිත්ගේ පෙළපතින් පැවතෙන්නෙක් නිසා ය.

4. ජේසුස් වහන්සේ අන්‍ය රූප විලාශවීමේ දී මෝසෙස් හා එළියා සමඟ ඇති වූ සාකච්ඡාවේ ප්‍රධාන මාතෘකාව වූයේ,
   (1) දස පණත නිසි ලෙස පිළිපැදීම ය.
   (2) පැරණි දිවැසිවරුන්ගේ දිවැස්වැකි පූර්ණත්වයට පත්වීම ය.
   (3) ජේසුස් වහන්සේගේ දෙවන ආගමනය ගැන ය.
   (4) ජේසුස් වහන්සේ ජෙරුසලමේ සිදු කිරීමට නියමිත ජීවිත පූජාව ගැන ය.

5. "වචනය තෙම ද මාංශගත වී අප සමඟ වාසය කළ සේක." කිතුනු ඒකක සාකච්ඡාවේ දී වැඩිහිටියෙක් ඉහත සඳහන් බයිබල් පාඨය විස්තර කළ අයුරු පහත දක්වෙන අතර එයින් වඩාත් නිවැරදි වනුයේ,
   (1) ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේ මනුෂ්‍යත්වය ලැබීම යන්න ය.
   (2) දේව වචනය මිනිස් හදවත්වලට ඇතුළුවීම යන්න ය.
   (3) දේව වචනය නිතර කියවීමට පෙලඹීම යන්න ය.
   (4) දේව වචනය තුළ සත්‍යයට සාක්ෂි දැරීම යන්න ය.

6. "මනුෂ්‍ය පුත්‍රයාණන් වැඩියේ සේවය ලැබීමට නොව සේවය කරන්නටත් බොහෝ දෙනෙකුගේ මිදීම උදෙසා ..................ය." හිස්තැනට යෙදෙනුයේ
   (1) ශුභාරංචිය දේසීමටත්  (2) සිය දිවි පිදීමටත්
   (3) දේව රාජ්‍යය පැතිරවීමටත්  (4) දේව ආදරය පෙන්වීමටත්

7. මැවිල්ල තුළින් දෙවියන් වහන්සේගේ මහිමය දකින අපි ............... තුළින් දෙවියන් වහන්සේව හමු වන්නේ ය. හිස්තැනට යෝග්‍ය වචනය වනුයේ
   (1) ප්‍රාතිහාර්ය  (2) සලකුණු  (3) යාච්ඤාව  (4) ව්‍යවස්ථාව

8. පාසල්වියේ පසුවන ඔබ විද්‍යාව දෙස බැලිය යුත්තේ කෙසේ ද?
   (1) විශ්ව ගම්මානයට පිවිසෙන දොරටුවක් ලෙස ය.
   (2) මිනිස් ජීවිත සුඛිත මුදිත කරන්නක් ලෙස ය.
   (3) මිනිස් ප්‍රයත්නයේ සාර්ථකත්වයක් ලෙස ය.
   (4) මිනිසාට ලැබී ඇති ප්‍රඥාවේ ප්‍රසාරණය වීමක් ලෙස ය.

9. කිතුනුවා තම පව් පූජාප්‍රසාධිතුමා ඉදිරියේ ප්‍රකාශ කරනුයේ
   (1) තමා දෙවියන් වහන්සේටත්, සමාජයටත් විරුද්ධව පව් කරන නිසා ය.
   (2) ප්‍රසිද්ධියේ පව් කීම ලැජ්ජා සහගත නිසා ය.
   (3) තම පව් තවත් කෙනෙකුට කීමට ඇති බිය නිසා ය.
   (4) තමන්ගේ ජීවිතයේ පෞද්ගලික භාවය රැකීම සඳහා ය.

10. යාච්ඤාව හා පශ්චාත්තාපික ක්‍රියා මගින් ලෝකයේ පාපී බලවේග පරාජය කිරීමට ඇති කරනු ලැබූ "මරියතුමියගේ ශ්‍රී හෘදයේ හමුදාව" නැමැති සංවිධානයේ නිර්මාතෘ වනුයේ
    (1) XII වන පියුස් පාප්තුමා ය.  (2) මැක්ෂිමිලියන් කෝල්බේ පියතුමා ය.
    (3) II ජුවාම් පාවුළු පාප්තුමා ය.  (4) තෙරේසා මව්තුමිය ය.

11. නිල පූජක ධුර මට්ටම් තුන වනුයේ
(1) රාජකීය, පූජක සහ දිවැසි ය. (2) ගිහි, පැවිදි සහ පූජක ය.
(3) රදගුරු, පූජක සහ තේවාචාරී ය. (4) රදගුරු, කාර්දිනල් සහ ශුද්ධෝත්තම පියතුමා ය.

12. මෙරට ලන්දේසි බල ප්‍රදේශ තුළ අධ්‍යාපනය පිළිබඳ ගන්නා ලද ප්‍රධාන තීන්දුව වූයේ
(1) ලන්දේසි භාෂාව අනිවාර්ය විෂයයක් කිරීම ය. (2) දහම් පාසල් නගා සිටුවීම ය.
(3) ගුරු විද්‍යාල පිහිටුවීම ය. (4) කතෝලික ධර්මය ඉගැන්වීම තහනම් කිරීම ය.

13. පැවිදි ව්‍රතාචාර වනුයේ
(1) දිළිඳුකම, ව්‍රත ශුද්ධිය හා කීකරුකම ය. (2) දිළිඳුකම, කීකරුකම හා බැහැපත්කම ය.
(3) බඹසර රැකීම, කීකරුකම හා නිර්භීතකම ය. (4) නිර්භීතකම, කීකරුකම හා බැහැපත්කම ය.

14. එම්මාවුස් ගමට ගිය ගෝලයින් දෙදෙනා එදිනම පෙරළා ජෙරුසෙලමට පිටත් වූයේ
(1) ජේසුස් වහන්සේගේ ශරීරය සොහොනෙහි නොතිබුණු බව දැන ගන්නට ලැබුණු නිසා ය.
(2) ජේසුස් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වී ඇතැයි යන පණිවුඩය ඔවුන්ට ලැබුණු නිසා ය.
(3) අනෙක් ගෝලයින් ඔවුන්ගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටි නිසා ය.
(4) උත්ථාන වූ ජේසුස් වහන්සේ ඔවුන් දුටු බව අනෙකුත් ගෝලයින්ට දන්වීම සඳහා ය.

15. උපන් ද සිට අන්ධව සිටි තැනැත්තෙකු සුව කිරීමේ ප්‍රාතිහාර්යය මඟින් පෙනී යන්නේ
(1) ජනතාව වෙත ඇති දෙවියන් වහන්සේගේ අසීමිත සානුකම්පිත ආදරය ය.
(2) මැවිල්ල නවතාවයකට පත් කිරීමට මැවුම්කරුට හැකි බව ය.
(3) දේව පුත්‍රයා ජුදා ජනතාව අතර තම කීර්තිය පතුරවා හැරිය බව ය.
(4) මිනිසා තුළ විශ්වාසය වැඩි කිරීමට දෙවියන් වහන්සේට හැකි බව ය.

16. සභාවේ ආරම්භක දිනය ලෙස සැලකෙනුයේ
(1) අහස් නැඟී මංගල්‍යය ද ය. (2) පෙන්තකොස්ත මංගල්‍යය ද ය.
(3) පාස්කු මංගල්‍යය ද ය. (4) ජයග්‍රාහී ලෙස ජෙරුසෙලමට ඇතුළු වූ ද ය.

17. ජාකොබ් නිසා ඒසව්ට සිදු වූ අසාධාරණය වන්නේ
(1) තම පෙළපතේ නායකත්වය අහිමිවීම ය. (2) තම සොයුරා අහිමිවීම ය.
(3) තම පියාගේ ආශිර්වාදය අහිමිවීම ය. (4) තමා ජීවත් වූ ප්‍රදේශයෙන් පලා යාමට සිදුවීම ය.

18. "නුසුදුසු ලෙස ස්වාමීන් වහන්සේගේ මේ රොටි වළඳන, මේ කුසලානෙන් පානය කරන කවරෙක් වුවද එසේ වැළඳීමෙන් හා පානය කිරීමෙන් ස්වාමීන් වහන්සේගේ ශරීරයට හා රුධිරයට විරුද්ධව පව් කිරීමේ වරදකරුවෙක් වන්නේ ය." යන ඉගැන්වීම සඳහන්වන ශුද්ධ වූ පාවුළු තුමාගේ ලිපිය වනුයේ
(1) ගලාති ලිපිය ය. (2) රෝම ලිපිය ය.
(3) II කොරෙන්ති ලිපිය ය. (4) I කොරෙන්ති ලිපිය ය.

19. "යමෙකු වතුරෙන් ද, ශුද්ධාත්මයාණන්ගෙන් ද නැවත නූපන්නොත් දෙවියන් වහන්සේගේ රාජ්‍යය දැක ගත නොහැකි ය" යනුවෙන් ජේසුස් වහන්සේ ප්‍රකාශ කළේ
(1) නිකදේමුස්ට ය. (2) පේදුරුට ය. (3) සකේවුස්ට ය. (4) තෝමස්ට ය.

20. අජිත් තම පියාට රෝගීන්ගේ ආලේපය දානය කිරීම සඳහා මීසමේ පියතුමා කැඳවා ගෙන පැමිණියේ
(1) ශුද්ධ වූ තෙලයෙන් තම පියා ආලේප කර ගැනීම සඳහා ය.
(2) තම පියාට ආධ්‍යාත්මික හා මානසික සුවය ලබා දීමට ය.
(3) තම පවුලේ සාමාජිකයන් සනසාලීමට ය.
(4) නැවත නැවත මෙම සක්‍රමේන්තුව ලබා ගැනීමට හැකි නිසා ය.

21. ජේසුස් වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානය හඳුන්වනුයේ
(1) මාංශගතවීම ලෙසිනි. (2) දේව අනාවරණය ලෙසිනි.
(3) පාස්කු අභිරහස ලෙසිනි. (4) තම දූත කාර්යේ සමාප්තිය ලෙසිනි.

22. කායින් විසින් ආබෙල් මැරීම තුළින් හෙළිදරව් වනුයේ
(1) කායින් මිනීමරුවෙක් බව ය.
(2) කායින් මානසික පීඩාකාරී තත්ත්වයකට පත්වූ බව ය.
(3) කායින් සහෝදරයාට දක්වූ ඊර්ෂ්‍යාව ය.
(4) කායින්, දෙවියන් හා ඔහුගේ සහෝදරයා සමඟ පැවති සම්බන්ධතාවය කඩා වැටීම ය.

23. "මාගේ අසල්වැසියා කවුද?" යන පැනයට පිළිතුරු වශයෙන් ජේසුස් වහන්සේ විසින් වදළේ
(1) යහපත් සමරිතානුවරයාගේ උපමාව ය.
(2) නාස්තිකාර පුත්‍රයාගේ උපමාව ය.
(3) වපුරන්නාගේ උපමාව ය.
(4) ධනවතා හා ලාසරස්ගේ උපමාව ය.

24. 'දන ගැන්මේ' දීමනාව විශ්වාසකයනට ලැබෙනුයේ ............... නැමති සක්‍රමේන්තුව මගිනි. හිස්තැනට යෝග්‍ය වනුයේ
(1) ප්‍රසාද ස්නාපනය
(2) අභිවෘද්ධි ආලේපය
(3) දිව්‍ය සත්ප්‍රසාදය
(4) පූජාත්වරය

25. ශ්‍රාවකයින්ගේ පාද සේදීම තුළින් ජේසුස් වහන්සේ අපට තහවුරු කරනුයේ
(1) වගකීම් ඉටු කළ යුතු බව ය.
(2) මුල් තැන ගෙන කටයුතු කළ යුතු බව ය.
(3) නායකයා සේවකයා විය යුතු බව ය.
(4) අන්‍යයන්ගේ සේවය ලබා ගත යුතු බව ය.

26. දිව්‍ය පූජාවට සහභාගි වීම තුළින්
(1) මීසම් පවුලේ සාමූහික යාගයට එක් වේ.
(2) ජේසු සමිඳුන්ගේ කුරුසියේ යාගයට එක් වේ.
(3) දේව ප්‍රශංසාවට මග පැදේ.
(4) දේව වචනයට සවන් දීමට අවකාශ ලැබේ.

27. සදචාර සම්පන්න සමාජයක් බිහි කිරීමට පාලකයින් සතු වගකීම් ගැන නායකත්ව කඳවුරක දී මෙලෙස සාකච්ඡා විය.
A - තමන්ගෙන් සේවය ලබන පුරවැසියන්ට සාධාරණය ඉටු කිරීම හා කාරුණික වීම
B - පාලක පන්තිය සුඛෝපභෝගී පැවැත්මක් සඳහා සේවක පන්තිය යොදා ගැනීම
C - තම නායකත්වය තුළ පැවරෙන වගකීම් අවංකව නිසි අයුරින් ඉටු කිරීම
D - පොදු සංවර්ධන කටයුතුවල දී ඇල්මැරුණු ස්වභාවයකින් කටයුතු කිරීම
ඉහත සඳහන් ප්‍රකාශ වලින් වඩාත් නිවැරදි වනුයේ
(1) A සහ B ය. (2) A සහ C ය. (3) B සහ C ය. (4) A, B, C සහ D ය.

28. මේරි තම විදුහලේ විදුහල්පති තුමාට, ගුරුවරුන්ට, ශිෂ්‍ය නායකයින්ට සහ සමාජයේ වැඩිහිටියන්ට ගරු කිරීම හා කීකරුවීම ඇගේ පන්තියේ ම සිටි අසුන්තා දුටුවේ,
(1) හොඳ නමක් ලබා ගැනීමට දරන ප්‍රයත්නයක් ලෙසිනි.
(2) මේරි විසින් වගකීම් හා යුතුකම් ඉටුකරන ආකාරය ය.
(3) කාගේත් හිත දිනා ගැනීමට මේරිට ඇති හැකියාව ය.
(4) යම් යම් වාසි තකා මේරි කටයුතු කරන අයුරු ය.

29. කිතුනුවා ලබා ඇති ප්‍රසාද ස්නාපනීය කැඳවීම ඉටු කළ යුතු මූලික වගකීම වනුයේ,
(1) සෑම ඉරු දිනක ම දිව්‍ය පූජාවට යාම ය.
(2) දුක් කරදර සතුටු සිතින් දරා ගැනීම ය.
(3) තම විශ්වාසයට සාක්ෂි දැරීම ය.
(4) සභා නායකයින්ට නිරතුරුව ම කීකරුවීම ය.

30. දහම් ගුරුතුමිය ඉරුදින දහම් පාසැලේ දී සදචාරාත්මක කිතුනුවෙක් ලෙස ජීවත්වීම සඳහා "අනුන්ගේ දේ සොරකම් නොකළ යුතු බව" ඉගැන්වූවා ය. මෙම ඉගැන්වීමට අනුව පිළිපැදිය යුතු පණත් දෙක වන්නේ,
(1) 4 සහ 8 ය. (2) 5 සහ 10 ය. (3) 7 සහ 8 ය. (4) 7 සහ 10 ය.

31. "යාච්ඤා කිරීමට නොදන්නා පුද්ගලයා ජීවත්වීමට නොදනී." මෙසේ පවසන ලද්දේ
(1) ශුද්ධ වූ ජෝන් ක්‍රිසොස්තම් තුමා ය.
(2) ශුද්ධ වූ ෆ්‍රැන්සිස් අසිසි තුමා ය.
(3) ශුද්ධ වූ අගොස්තිනු තුමා ය.
(4) ශුද්ධ වූ බෙනදික් තුමා ය.

32. ගෙත්සමනි උයනේ දී ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයින්ට අවවාද කළේ,
(1) උන්වහන්සේ ආරක්ෂා කිරීමට සූදානම් වෙන්නැයි කියා ය.
(2) පරීක්ෂාවට නොවැටෙන ලෙස යාච්ඤා කරන්න යැයි කියා ය.
(3) සතුරන් පැමිණුනොත් පලා යන්න යැයි කියා ය.
(4) දේව දූත සේනාවක් පැමිණෙන තුරු බලා සිටින්න යැයි කියා ය.

33. ජේසුස් වහන්සේ නිතර නිතර දෙවි පියාට යාච්ඤා කළේ,
(1) ජුදෙව් නීතිය පිළිපැදීම සඳහා ය.
(2) යක්ෂ පරීක්ෂාවලට හසු නොවීමට ය.
(3) දේව කැමැත්ත දන ගැනීම සඳහා ය.
(4) යාච්ඤාව පිළිබඳව ගෝලයින් දැනුවත් කිරීමට ය.

34. නොකඩවා යාච්ඤා කිරීමේ අගය පෙන්වා දෙන උපමාව වන්නේ
(1) පරිසිවරයා හා අයකැමියා ය.
(2) යුවතියන් දසදෙනා ය.
(3) යහපත් සමරිතානුවරයා ය.
(4) වැන්දඹුව හා විනිශ්වයකාරයා ය.

35. උත්තම පූජක යාච්ඤාව ක්‍රිස්තුස් වහන්සේ
    (1) ගෝලයින්ට ඉගැන්වූ යැදුමකි.
    (2) ගෝලයින් සමඟ කළ යැදුමකි.
    (3) ශ්‍රාවකයින් තෝරා ගැනීමට පෙර කළ යැදුමකි.
    (4) තමන් විසින් ම දෙව් පියාට කරන ලද යැදුමකි.

36. ඔබ පවුලේ සැම දෙනා එක් රැස් වී දිනපතා යාච්ඤා කිරීම කුමන යාච්ඤා වර්ගයට අයත් වේ ද?
    (1) සාමූහික (2) පෞද්ගලික (3) පොදු (4) භාවනා

37. "රෝගීන්ට මිස නිරෝගීන්ට වෙදගෙන් වැඩක් නැත." ජේසුස් වහන්සේ මෙයින් අදහස් කරනුයේ
    (1) දෙවියන් වහන්සේගේ අසීමිත ආදරය ය.
    (2) දෙවියන් වහන්සේ පව්කාරයාට දක්වන අපිරිමිත දයාව ය.
    (3) රෝගීන්ට සුවය දනය කිරීම දෙවියන් වහන්සේ සතු බව ය.
    (4) රෝගීහු සුවය පතා යාච්ඤා කළ යුතු බව ය.

38. කිතුනුවන් යාච්ඤා කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ
    (1) දෙවියන්ගෙන් කැමති ඕනෑම දෙයක් ඉල්ලා ගැනීම ය.
    (2) ශුද්ධවන්තයින් ලෙස පෙනී සිටීම ය.
    (3) දෙවියන් වහන්සේ සමඟ ඇති සම්බන්ධතාව තහවුරු කර ගැනීම ය.
    (4) අපගේ පව් වලට පසුතැවිලි වීම ය.

39. ප්‍රශංසාව හා ඉල්ලීම අන්තර්ගත වී ඇති යාච්ඤාව නම්
    (1) උත්තම පූජක යාච්ඤාව ය. (2) යාම යැදුම ය.
    (3) තුන්කාල ආරාධනාව ය. (4) ස්වාමිවාක් ආරාධනාව ය.

40. "දේව සමානකම" කුමක් ද යන්න එක්තරා වැඩිහිටියෙක් පහත සඳහන් අයුරින් ප්‍රකාශ කළේ ය. ඒ අතරින් වඩාත් සුදුසු වනුයේ
    (1) දෙවියන් වහන්සේගේ හැඩයට ඔබින අයුරින් මැවීම ය.
    (2) දෙවියන් වහන්සේ මෙන් සියල්ලේ අධිපති වීම ය.
    (3) මිනිසා ප්‍රඥාවන්තව, නිදහස් කැමැත්තක් ඇතිව අමරණීයතාවකට පත්වීම ය.
    (4) සියල්ලෙන් ම සෑහීමකට පත් වී ජීවත් වීම ය.

## 2.1.3. අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

**ලකුණු දීමේ පටිපාටිය - I පත්‍රය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 1 | 21. | 3 |
| 02. | 2 | 22. | 4 |
| 03. | 3 | 23. | 1 |
| 04. | 4 | 24. | 2 |
| 05. | 1 | 25. | 3 |
| 06. | 2 | 26. | 2 |
| 07. | 3 | 27. | 2 |
| 08. | 4 | 28. | 2 |
| 09. | 1 | 29. | 3 |
| 10. | 2 | 30. | 4 |
| 11. | 3 | 31. | 1 |
| 12. | 4 | 32. | 2 |
| 13. | 1 | 33. | 3 |
| 14. | 4 | 34. | 4 |
| 15. | 1 | 35. | 4 |
| 16. | 2 | 36. | 1 |
| 17. | 3 | 37. | 2 |
| 18. | 4 | 38. | 3 |
| 19. | 1 | 39. | 4 |
| 20. | 2 | 40. | 3 |

**නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 40කි.**

### 2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

★ I පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාරය 1 (පිටුව 8) ඇසුරෙන් සකස් කර ඇත.

- ප්‍රශ්න අංක 01, 04, 18 හැර ඉතිරි සියලු ප්‍රශ්නවලට අපේක්ෂකයන්ගේ සාර්ථකත්වය 50% ඉක්මවා ගොස් ඇත.
- ප්‍රශ්න අංක 07, 20,27 ප්‍රශ්න සඳහා අයදුම්කරුවන්ගෙන් 90% ඉක්මවා නිවැරදි පිළිතුරු සපයා ඇත.
- ප්‍රශ්න අංක 02, 09, 21, 28, 32 සහ 38 ප්‍රශ්නවලට 80%ක් පමණ අපේක්ෂකයෝ නිවැරදිව පිළිතුරු ලබා දී ඇත.
- ප්‍රශ්න අංක 08, 12, 13, 15, 23, 24, 25, 36, 37 සහ 39 ප්‍රශ්න සඳහා අපේක්ෂකයන්ගෙන් 70%ක්ම නිවැරදිව පිළිතුරු සපයා ඇත.
- ප්‍රශ්න අංක 01, 04, 18 ප්‍රශ්නවලට අපේක්ෂකයන්ගේ සාර්ථකත්වය 50% අඩු මට්ටමක පවතී.
  - ★ පළමු ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර සපයා ඇත්තේ 45% පමණ පිරිසකි. (ප්‍රස්තාර අංක 1 ඇසුරිනි)
    "දෙවියන් වහන්සේ ලෝකය මැවූ සේක." යන්න පිළිබඳව නිවැරදි දැනුමක් අපේක්ෂකයන් බොහෝ පිරිසකට ඇතත්, නිවැරදි පිළිතුර තෝරා ගැනීමට අපේක්ෂකයන්ගෙන් 55%ට පමණ හැකියාව නොතිබීමෙන් පෙනී යන්නේ දෙවියන් වහන්සේ හා මැවිල්ල සම්බන්ධව ගැඹුරින් සිසුන්ට දැනුම ලබා දිය යුතු බවයි.
  - ★ ප්‍රශ්න අංක 04 වැඩිම පිරිසකට නිවැරදි පිළිතුරු සැපයීමට අපහසු වූ ප්‍රශ්නයයි. එහි නිවැරදි පිළිතුර සපයා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 25% පමණ පිරිසකි. එයට හේතුපාදක වී ඇත්තේ 'අන්‍ය රූප විලාසය හා දේව පුත්‍ර භාවය' පිළිබඳව සිසුනට දැනුම තිබුණ ද එහි දී සිදු වූ සාකච්ඡාව පිළිබඳව දැනුම්වත් වී නොමැති නිසාය.
  - ★ ප්‍රශ්න අංක 18 අනුව සිසුන් තුළ පාවුළු සංදේශ පිළිබඳ දැනුම පුළුල් කළ යුතු බව තහවුරු වේ. එම ප්‍රශ්නයට නිවැරදි පිළිතුර සැපයූ ප්‍රතිශතය 37% පමණ වේ.
- ප්‍රශ්න අංක 27 වැඩිම පිරිසක් නිවැරදි පිළිතුර සැපයූ ප්‍රශ්නයයි. එහි ප්‍රතිශතය 94% පමණ වේ. එයට හේතුව සදාචාර සම්පන්න සමාජයක් බිහි කිරීම සම්බන්ධව ප්‍රායෝගික ජීවිතය ඇසුරින් ප්‍රශ්නය සකස් කර තිබීමයි.
- නිතර ශුද්ධ බයිබලය අධ්‍යයනය කිරීම තුළින් දැනුම පුළුල් කරගැනීමට ගුරු සිසු දෙපිරිසට වැඩි අවධානයක් යොමුකළ යුතුව ඇත.

## 2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

ප්‍රශ්න හතකින් යුක්ත ය. කාලය පැය 02යි. පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්නයකි. එය කොටස් 10කින් සමන්විත වේ. එක කොටසකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20කි. සෙසු ප්‍රශ්න 6න් 4කට පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 40කි.

### 2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය සහ නිරීක්ෂණ හා නිගමන

★ **II** පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර අංක 2, 3 සහ 4 ඇසුරින් සකස් කර ඇත.

## 1 ප්‍රශ්නය

**1. (i) දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට දෙන ලද පොරොන්දු දෙකක් ලියන්න.**

**(ii) ඉශ්‍රායෙල් ජනතාව පොරොන්දු දේශයට යන ගමනේ දී දෙවියන් වහන්සේ ඔවුන් පෝෂණය කළ ආහාරයත්, නව ගිවිසුමේ ක්‍රිස්තුස් වහන්සේ ස්ථාපිත කළ භෝජනයත් වෙන් වෙන්ව නම් කරන්න.**

**(iii) දෙවියන් වහන්සේ තම පුත්‍රයාණන්ගේ 'පුත්‍ර භාවය' හෙළි කළ අවස්ථා දෙකක් ලියන්න.**

**(iv) ජේසුස් වහන්සේ රෝගීන් සුව කළ ආකාර දෙකක් ලියන්න.**

**(v) පෙන්තකොස්ත මංගල්‍යය දින ශ්‍රාවකයන් වෙත ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩම කිරීම සංකේතවත් කරන සලකුණු දෙකක් නම් කරන්න.**

**(vi) ලූක් සුවිශේෂයේ සඳහන් ප්‍රශංසා ගීත (උදන ගී) දෙකක් ලියන්න.**

**(vii) ශුද්ධ වූ සභාවේ යාච්ඤා වර්ග (ප්‍රභේද) දෙකක් නම් කරන්න.**

**(viii) ශුද්ධ වූ සභාව ජන වන්දනාව තුළ අද්විතීය ලෙස සමරන මෙහෙය කුමක් ද?**

**(ix) කතෝලික විවාහයට ඇති බාධා දෙකක් නම් කරන්න.**

**(x) මෙරට පෘතුගීසි යුගයේ දී ධර්ම දූත සේවාව සඳහා පැමිණි පළමු ධර්ම දූත කණ්ඩායම් දෙකක් නම් කරන්න.**

*(ලකුණු 2 × 10 = 20 යි)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(1) (i)
- දරු පරපුරක් (විශාල ජාතියක් ඇති කරන්නෙමි. අහසේ තරු මෙන් ද .....)
- ස්ථිර දේශයක්
- ආබ්‍රහම්ගේ නාමය ආසිරි පැතීමේ නාමයක් සේ කීර්තියට පමුණුවන බව (උත්.12:2)

(ii)
- පුරාණ ගිවිසුමේ දී "මන්නා" නැමති ආහාරය මඟින්
- නව ගිවිසුමේ දී දිව්‍ය සත්ප්‍රසාදය (දිව්‍ය ශ්‍රී පූපය හා ශ්‍රී රුධිරය මඟින්)

(iii)
- ජෝර්දාන් නදියේ දී ස්නාවක ජුවාම්තුමාගෙන් බෞතීස්ම ස්නාපනය ලබන විට (ලූක් 3:21-22)
- අන්‍ය රූප විලාශ වීම සිද්ධිය තුළින් (ලූක් 9:35)

(iv)
- ස්පර්ශ කිරීමෙන්
- ද්‍රව්‍ය භාවිතයෙන්
- විශ්වාසය මත
- වචනයේ බලයෙන්

(v)
- ගිනි දලු වැනි දිව්
- සැඩ සුළඟ (ක්‍රියා පොත 2:2-3)

(vi)
- මරිය උදාන ගීය (ලූක් 1:50-55)
- සෙකරියස්ගේ ප්‍රශංසා ගීය (ලූක් 1:68-79)
- සිමියොන්ගේ උදාන ගීය (ලූක් 4:18-19)

(vii)
- වාචික
- ධ්‍යානයට සම වැදීම
- භාවනා

(viii)
- පාස්කු අභිරහස මඟින් ක්‍රිස්තුන් වහන්සේගේ ගැළවීමේ කාර්ය උත්සවාකාරයෙන් පැවැත්වීම. (දිව්‍ය පූජා යාගය)

(ix)
- ලේ නෑකම
- මිශ්‍ර ආගම්
- අඩු වයස
- ඥාන මව්පිය නෑකම්

(x)
- ෆැන්සිස්කානු නිකාය
- දොමිනිකාන නිකාය
- ජේසු නිකාය
- අගුස්තීන නිකාය

*(ලකුණු 2 × 10 =20 යි.)*

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

අනිවාර්ය ප්‍රශ්නයකි. එහෙත් පිළිතුර සපයා තිබුණේ අපේක්ෂකයන්ගෙන් 98% පමණ පිරිසකි. (ප්‍රස්තාරය 2 ඇසුරිනි.) මෙය කෙටි ප්‍රශ්න 10කින් යුක්ත ය. එයට හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි. අපේක්ෂකයන්ගෙන් 29% පමණ පිරිසක් 76% - 100% අතර ප්‍රමාණයේ ලකුණු (16 - 20 අතර) ලබාගෙන ඇත. (ප්‍රස්තාරය 3 ඇසුරිනි.) එසේම 14% පමණ පිරිසක් 0% - 25% අතර (0 - 5 අතර) ප්‍රමාණයේ ලකුණු ලබා අසාර්ථකත්වයට පත්ව සිටිති.

එසේම මෙම ප්‍රශ්නයේ (ix) කොටසට සාර්ථකව පිළිතුරු සපයා තිබුණේ 35% පිරිසකි. (ප්‍රස්තාරය 4 ඇසුරිනි) එබැවින් ආශිර්වාදකාර බන්ධනය ප්‍රසාද නිධානය පිළිබඳව සිසුනට කරුණු අවබෝධ කරදෙන අවස්ථාවේ දී ම ඊට ඇති බාධා ද නිවැරදිව අවබෝධ කළා නම් එහි ප්‍රතිඵලය මීට වඩා සාර්ථකවීමට ඉඩ තිබුණි. එම ප්‍රශ්නයේ ඉතිරි කොටස් 9 සඳහාම 45%කට වැඩි පිරිසක් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

දෙවන පත්‍රයේ පළමු ප්‍රශ්නයේ සියලුම අනුකොටස් සකස් වී ඇත්තේ පෙළ පොතට අදාළව සිසුන්ගේ සාධන මට්ටමට ගැළපෙන සේ ය. එබැවින් බොහෝ සිසුන් වැඩි ලකුණු ප්‍රමාණයක් උපයා ගැනීමට සමත්ව තිබුණි. එසේම පෙළ පොතට පිටතින් සකස් කරන ලද ප්‍රශ්න නොතිබුණු නිසා මීටත් වඩා සාර්ථක පිළිතුරු සපයන්නට හැකියාව තිබිය යුතුය. එබැවින් පෙළ පොත පරිශීලනයට සිසුන් මීට වඩා යොමු වීමත්, යොමු කිරීමත් අවශ්‍ය වේ.

## 2 ප්‍රශ්නය

අරමුණ : ශ්‍රී ලංකාවේ කතෝලික විශ්වාසය උරුමකරදීමේ පුරෝගාමිත්වය තුළ වර්තමානයේ ජීවිත පැවැත්මේ අවබෝධය ගැන විමසීම.

2. (i) මෙරට ලන්දේසි පාලන සමය තුළ කතෝලික විශ්වාසය රැක ගැනීමට පුරෝගාමී වූ ඔරතෝරියානු පියවරු **දෙදෙනෙකු** නම් කරන්න.

(ii) පෘතුගීසි ධර්ම දූත සේවය මෙරට සාර්ථක වීමට බලපෑ හේතු **තුනක්** දක්වන්න.

(iii) කතෝලික විශ්වාසය රැක ගැනීම සඳහා ඔබේ මීසම තුළ ඔබට ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාකාරකම් **පහක්** වචන 75 කින් පමණ විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(2) (i)
1. භාග්‍යවත් ජුසේවාස් පියතුමා
2. ජෝශප් මෙනසස් පියතුමා
3. ජෝශප් රවෙල්ලෝ
4. ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා
5. මනුවෙල් ද මිරැන්ඩෝ පියතුමා
6. මිගෙල් ද මෙල්ලෝ

*(ලකුණු 02 යි.)*

(ii)
- පෘතුගීසි ධර්මදූතවරුන් ලාංකීය ජන ජීවිතයට ඉතා සමීප පිරිසක් වීම.
- දේශීය භාෂා (සිංහල හා දෙමළ) ඉගෙන ගෙන ධර්මය ප්‍රචාරය කිරීම.
- ධීවර ජනාවාස ප්‍රදේශවලින් ධර්ම ප්‍රචාර කටයුතු ඇරඹීම.
- සියලුම ජන කොටස්වලට එක හා සමාන ලෙස සැලකීම.
- සරල අල්පේච්ඡ ජීවිත පැවැත්ම.
- දෙව් මැදුරු හා පාසල් ඉදිකර ඒ තුළින් කතෝලික අධ්‍යාපනය බෙදා හැරීම.

*(ලකුණු 02 යි.)*

(iii)
- මරිය හමුදාව, වින්සන් ද පාවුලා සමිතිය, දිව්‍ය හෘදයේ සමාගම, යෞවන සමාජ, ල.ක්‍රි.වි. සමිතිය වැනි සමිති මඟින් ක්‍රියාකාරීව කටයුතු කිරීම.
- කතෝලික භක්ති අභ්‍යාස මගින් මීසම තුළ ක්‍රියාකාරීව කටයුතු කිරීම.
- දහම් පාසල් අධ්‍යාපනයට සම්බන්ධ වී දහම් පාසල් නඟා සිටුවීමට කටයුතු කිරීම.
- ජන වන්දනාවට අර්ථවත්ව සහභාගී කරවීම.
- සක්‍රමේන්තු ලබාගැනීමට ජනතාව දිරිමත් කිරීම හා ඒ තුළ ජීවත් වීමට සැලසීම.
- දේව වාක්‍යය හා ආගමික පොත් පත් කියවීමට සැලැස්වීම.

*(මෙවැනි කරුණු ගොනුකර ඇති අයුරු සැලකිල්ලට ගෙන ලකුණු 05 ක් දෙන්න.)*

### පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

සමස්ත අපේක්ෂකයන්ගෙන් 67%ක් පමණ තෝරාගත් ප්‍රශ්නයකි. (ප්‍රස්තාර අංක 2 ඇසුරිනි). ඒ අතුරින් 59%ක පමණ පිරිසක් 76% - 100%අතර වූ ඉහළ ලකුණු (8 - 10 අතර) ලබාගෙන ඇත. එසේම අපේක්ෂකයෝ 4%ක පමණ සුළු ප්‍රමාණයක් 0% - 25% අතර ලකුණු (0 - 2 අතර) ලබා අසාර්ථක වී සිටිති.

මෙම ප්‍රශ්නයේ (i), (ii) කොටස් සඳහා අපේක්ෂකයන්ගෙන් 76% ක පමණ පිරිසක් ද (iii) කොටස සඳහා 88% ක් පමණ පිරිසක් ද සාර්ථකව පිළිතුරු සපයා ඇත. (ප්‍රස්තාර අංක 4 ඇසුරිනි). ප්‍රශ්න පත්‍රයේ වැඩිම ලකුණු උපයාගෙන ඇති ප්‍රශ්නය ද මෙයයි. එයට හේතුව සිරිලක කිතු සසුන පිළිබඳ ඉතිහාස කතාව හැදෑරීමට දරුවා දක්වන උනන්දුව හා කැමැත්තයි.

3 ප්‍රශ්නය

අරමුණ : ක්‍රිස්තුන් වහන්සේ යාච්ඤාව තුළින් දෙවියන් වහන්සේට සම්බන්ධ වී උන්වහන්සේ කැමැත්ත ඉටු කළා සේ කිතුනු සිසුවා ද ක්‍රිස්තු ප්‍රතිපත්ති තුළ සාක්ෂි දැරීමේ නිපුණතාවය අවබෝධ කර ගෙන ගැනීම ක්‍රියා කරන අයුරු සොයා බැලීම.

3. (i) **ජේසුස් වහන්සේ පෞද්ගලිකව යාච්ඤා කළ අවස්ථා දෙකක් ලියන්න.**

(ii) **"නිර්මල සිත් ඇත්තෝ භාග්‍ය වන්තයෝ ය. ඔවුහු දෙවියන් වහන්සේ දකින්නෝ ය." කරුණු තුනක් ඉදිරිපත් කරමින් මෙම අදහස පැහැදිලි කරන්න.**

(iii) **ජේසුස් වහන්සේ වදළ භාග්‍ය අට මගින් ඔබේ ජීවිතයට උචිත ප්‍රතිපත්ති පහක් කෙටියෙන් විස්තර කරන්න.**

*(ලකුණු 10 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(3) (i)
1. දිනපතා හිරු උදාවට කලින් උන්වහන්සේ අවදිව හුදකලා තැනකට ගොස් එහි යාච්ඤා කළ සේක. (මාක් 1:35)
2. ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කිරීමට ප්‍රථම පාළුකරේ දී දින 40ක් නිරාහාරශීලව යාච්ඤා කිරීම. (ලූක් 4:1-13)
3. ප්‍රාතිහාර්යන් කිරීමට පෙර යාච්ඤා කිරීම.
4. ගෙත්සමෙනි මල් උයනේ දී යාච්ඤා කිරීම.
5. කුරුස ගසේ දී යැදීම *(ලකුණු 02 යි.)*

(ii)
- නිර්මල ජීවිතය උතුම් බව දැක්වීම
- දේව වන්දනාවට සහභාගී වන විට පිවිතුරු සිතක් හා ගතක් ඇතිව සිටිය යුතු ය.
- දෙවියන් වහන්සේ කෙරෙහි එක් සිත්ව අචල භක්තියකින් සිටීම.
- දූෂිත හදවතින් නපුර ප්‍රකාශ වේ. පිවිතුරු හදවත් ඇති තැනැත්තා නිහතමානි වේ. ඒ තැනැත්තා දෙවිඳුන්ගේ හා මිනිසුන්ගේ ප්‍රසාදයට පාත්‍ර වේ.
- නිර්මල සිතක් උරුම කර ගැනීමේ වටිනාකම ලෞකික ලෙස මැනිය නොහැක.

*(ලකුණු 03 යි.)*

(iii)
- මා බැගෑපත්ව දෙවියන් වහන්සේගේ සරණ පතමි.
- ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් දුක් පීඩා විඳිම තුළින් තවත් කෙනෙකුට සැනසීම දීම.
- නිහතමානිකම ජීවිතයේ උතුම් ගුණ ධර්මයක් සේ පිළිගැනීම.
- අයුක්තිය පිටු දකින පුද්ගලයෙක් වෙමි.
- සාමය අගය කරන්නෙක් වෙමි.
- දයාවන්ත පුද්ගලයෙක් වීම.
- ශෝකාකුල අවස්ථාවලට මුහුණ දීමට සිදු වූවත් නොසැලී දෙවියන් වහන්සේ තුළ විශ්වාසයෙන් සිටීම. ***(මෙවැනි කරුණු 5ක් ගොනුකර ඇත්නම් ලකුණු 05 යි.)***

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

මෙම ප්‍රශ්නය සමස්ත අපේක්ෂකයන්ගෙන් 72%ක් පමණ තෝරාගත් ප්‍රශ්නයකි. එම අපේක්ෂකයන් අතරින් 52කට වැඩි පිරිසක් 76% - 100% එනම් ලකුණු 8-10 අතර ඉහළම ලකුණු ලබාගන්නට සමත් වී සිටිති. 18%ක පමණ අපේක්ෂක පිරිසක් 51% - 75% එනම් ලකුණු 6-7 අතර ප්‍රමාණයක් ලබා ඇත. 26% - 50% අතර වූ එනම් ලකුණු 3-5 අතර ලකුණු ලැබුවෝ 25% පමණ වේ. අවම ලකුණු පරාසය වන 00% - 25% (0-2 අතර) ප්‍රමාණයේ ලකුණු ලබා අසාර්ථක වූ අපේක්ෂකයෝ 6% පමණ වූහ.

මෙම ප්‍රශ්නයේ (i) කොටසට 87%ක් පමණ සාර්ථක පිළිතුරු ලබා දී ඇත. එයට හේතුව කෙලින්ම දැනුමට එල්ල වූ ප්‍රශ්නයක් වීමයි. එහෙත් (ii) හා (iii) අනු කොටස් කන්ද උඩ දේශනයට සම්බන්ධ වූ ප්‍රශ්න වේ. එහිදී සිසුන් භාග්‍ය අට තම ජීවිතයට ගළපා ගැනීමට අසමත් වූ ආකාරය පෙනෙන්නට තිබේ. මේ අනුව ශුද්ධ සභාවේ ව්‍යවස්ථාව වූ භාග්‍ය අට පිළිබඳව මීට වඩා සිසුන්ට දැනුම ලබාදිය යුතුව ඇත.

## 4 ප්‍රශ්නය

අරමුණ : දේව අණපනත් අනුසාර කිරීමෙන් කිතුනු ජීවිත පැවැත්මේ තත්ත්වය විමසා බැලීම.

4. (i) දස පණතේ අන්තර්ගත වී ඇති මූලික ඉගැන්වීම් **දෙක** ලියන්න.
   (ii) කතෝලික ධර්මෝපදේශයට අනුව අටවන පණතින් අපට නියෝග කරන ඉගැන්වීම් **තුනක්** ලියන්න.
   (iii) දස පණත පිළිපදින කිතුනුවකු වන ඔබ පිළිපැදිය යුතු ධර්ම ගුණ **පහක්** ලියන්න. *(ලකුණු 10 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(4) (i)
- දෙවියන් වහන්සේට වන්දනා කිරීම හා සාක්ෂි දැරීම.
- අසල්වැසියාට ප්‍රේම කිරීම.

*(ලකුණු 02 යි.)*

(ii)
- අල්ලස් ගැනීම හා දූෂණ ක්‍රියාවලින් වැළකී සිටීම.
- අනුන් නොමග යවන කතා නොකිරීමට ප්‍රවේශම් වීම.
- අසත්‍ය තොරතුරු ප්‍රචාරය නොකිරීම.
- නැති දේ මවා පාමින් ගතු කේලම් කීමෙන් වැළකීම.
- ඕපාදූප සෙවීමෙන් වැළකීම.
- නිළ රහස් හෙළි නොකිරීමට වග බලා ගැනීම.
- සත්‍යවාදී තැනැත්තා අවංක හා ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතුව කටයුතු කරයි.

*(ලකුණු 05 යි.)*

(iii)
- දෙවියන් වහන්සේට ආදරය කිරීම හා විශ්වාසවන්ත වීම.
- ශුද්ධ මංගල දිනවලදී දිව්‍ය පූජාවට සහභාගි වීම.
- දේව මෙහෙයන්ට භක්තියෙන් හා ගෞරවයෙන් සහභාගි වීම.
- අන් අයට ආදරය හා ගෞරවය දැක්වීම.
- දෙමාපියන්ට හා වැඩිහිටියන්ට ගෞරවයෙන් හා ආදරයෙන් සැලකීම.
- සදාචාර සම්පන්න ජීවිත පැවැත්මක් අගය කිරීම හා ජීවත් වීම.
- පොදු දේපළ හා අන් අයගේ දේපළවලට ගරු කිරීම හා විනාශ නොකිරීම.
- සත්‍යවාදීව හා යුක්ති ගරුක වීම.

*(ලකුණු 05 යි.)*

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන :**

මෙම ප්‍රශ්නය අපේක්ෂකයන්ගෙන් 71% පමණ පිරිසක් තෝරාගෙන ඇත. ඒ අතරින් 40% ප්‍රමාණයක් ඉහළට ලකුණු සීමාවේ එනම් 76%-100% (8-10 අතර) සිටිති. තවත් 22%ක පිරිසක් ලකුණු 51%-75% (6-7 අතර) සීමාවේ සිටින අතර 29% පමණ පිරිසක් 26%-50% (3-5 අතර) ත් 9%පමණ පිරිසක් අවම ලකුණු 0%-25% (0-2 අතර) මට්ටමේත් සිටිති.

(i) කොටස සඳහා අපේක්ෂකයන් 60%ක ප්‍රමාණයක් පමණක් සාර්ථකව ලකුණු ලබා තිබුණි. දස පණත ඇසුරින් සකස් කර තිබූ මෙම ප්‍රශ්නය අවම ලකුණු ලබාගත යුතු ප්‍රශ්නයක් නොවේ. එහෙත් එහි (ii) කොටසේ ලකුණු මට්ටම 50%කි. එයට හේතුව විය හැක්කේ දසපණත දැනගත්ත ද නිවැරදිව අංක අනුව නම් කිරීමේ දී දක්වන ලද දුර්වලතාවයයි. එබැවින් ඒ පිළිබඳව සිසුනට නිවැරදි මග පෙන්වීමක් ලැබිය යුතුය. (iii) කොටස සඳහා ලබා ඇති 87%ලකුණු ප්‍රතිශතය සලකා බැලීමේ දී දස පණත පිළිබඳ දැනුම ඇති බව තහවුරු වේ. (i) කොටස සඳහා සපයා ඇති පිළිතුර ද එතරම් සාර්ථක වී නැත. එබැවින් දස පණතේ මූලික ඉගැන්වීම මීට වඩා තහවුරු කළ යුතුව ඇත.

## 5 ප්‍රශ්නය

අරමුණ : කිතුනු සංසයා තුළ ගිහි පැවිදි දෙපාර්ශවයේ වගකීම් හා යුතුකම් ගැන සිසුවා තුළ ඇති ආකල්ප සොයා බැලීම.

5. (i) **ශුද්ධ වූ සභාව තුළ සියලු ක්‍රිස්තියානි විශ්වාසකයින් බෙද වෙන් කරන ප්‍රධාන කොටස් දෙක කුමක් ද?**

(ii) **ආත්මික නායකයින් වෙත ගිහියා විසින් ඉටු කළ යුතු යුතුකම් තුනක් ලියන්න.**

(iii) **කතෝලික සභාවේ ගිහි දූත සේවාවන්ගෙන් (සමිති සමාගම් වලින්) ඉටුවන කාර්යයන් පහක් පැහැදිලි කරන්න.**

*(ලකුණු 10 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(5) (i)
- ගිහි
- පැවිදි *(ලකුණු 02 යි.)*

(ii)
- පූජක හා පැවිදිවරුන් වෙනුවෙන් යාච්ඤා කිරීම.
- ඔවුන්ට ගෞරව කිරීම.
- සභාවේ අවශ්‍යතා සඳහා මූල්‍යමය ආධාර ලබා දීම.
- දේව රාජ්‍යය පතළ කිරීමේ කටයුතුවලදී සහය දැක්වීම.
- මීසමේ සමිති සමාගම්වලට සම්බන්ධ වී සේවය කිරීම.
- ජන වන්දනා කටයුතුවලට සහාය වීම. *(ලකුණු 03 යි.)*

(iii) මරිය හමුදාව
- යාච්ඤා කිරීම, ලෙඩුන් බැහැ දැකීම, නිවෙස් බැහැ දැකීම, දේවස්ථානයෙන් ඈත්වී සිටින අය දේවස්ථානයට ලං කිරීම.

දිව්‍ය හෘදය සමිතිය
- ස්වේච්ඡාවෙන් දරුවන්ට ධර්මය ඉගැන්වීම.

වින්සන්ද පාවුලා
- අසරණවූවන්ට සහනාධාර ලබා දීම, පීඩිතයින්ව මානසිකව ශක්තිමත් කිරීම.

පූජාවට උදව් වන සමිතිය
- දිව්‍ය පූජාවට උදව් වීම, ජන වන්දනා කටයුතුවලදී එම මෙහෙයන්ට සහය වීම.

ධර්ම දූත ළමා සමාජ
- කුඩා දරුවන්ට ජේසුව හඳුන්වා දීම, දහම් ඉගැන්වීම, ක්‍රියාකාරකම් තුළින් ක්‍රිස්තුන් වහන්සේට අත්දැකීම හා සාක්ෂි දැරීමට පෙළඹවීම.

ජන වන්දනා කමිටුව
- ඉරුදින දිව්‍ය පූජාව සැලසුම් කිරීම හා මීසමේ සෙසු මංගල්‍යයන් හි ජන වන්දනාව අර්ථාන්විතව සංවිධානය කිරීම තුළින් දෙවියන් වහන්සේට වන්දනා කිරීම.

*(ලකුණු 05 යි.)*

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන :**

අපේක්ෂකයෝ 52% පමණ තෝරාගත් ප්‍රශ්නයකි. සමස්ත ප්‍රශ්න පත්‍රය ගැන සැලකීමේ දී අවම පිරිසක් තෝරාගත් ප්‍රශ්නයක් සේ පෙනේ. (i), (ii) සහ (iii) යන අනු කොටස් තුනටම සමාන ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයන්ගෙන් 54% පමණ දෙනා 76%-100% අතර එනම් ලකුණු 8-10 අතර ලබා ඇත. 51%-75% අතර වන, එනම් 6-7 අතර ලකුණු ලබාගත් පිරිස 18% පමණ වෙති. 26%-50% අතර වන, එනම් 3-5 අතර ලකුණු ලබාගත්තෝ 22% පමණ වන අතර, අවම ප්‍රතිශතය වූ 0%-25% (ලකුණු 0-2 අතර) 7%ක පමණ පිරිසක් රැඳී සිටිති.

මෙම ප්‍රශ්නය අවම පිරිසක් තෝරාගත් ප්‍රශ්නයක් වූව ද සමස්ත ලකුණු ගැන සැලකීමේ දී කොටස් ත්‍රිත්වයේම ලකුණු 80% ආසන්න මට්ටමක පැවතුණි. ශුද්ධ වූ සභාව පිළිබඳ ගිහි/පැවිදි වගකීම් සිසුනට අවබෝධ වී ඇති බවත් ඔවුන් පෙළ පොත හොඳින් පරිශීලනය කර ඇති බවත් මෙයින් පැහැදිලි වේ.

## 6 ප්‍රශ්නය

අරමුණ : ජේසුස් වහන්සේ ගෝලයින් තෝරා පත් කිරීමේ දී අනුගමනය කළ නිර්ණායකයන් තුළ වර්තමාන කිතුනු සිසුවා තම කිතුනු කැඳවීම කොතෙක් දුරට ගොඩනගා ගෙන ඇද්දැයි තහවුරු කර ගැනීම.

**6. (i) ක්‍රිස්තුස් වහන්සේ ශ්‍රාවකයින් දොළොස් දෙනා තෝරා පත් කිරීමේ දී ඔවුන්ට දුන් බලතල දෙකක් සඳහන් කරන්න.**

**(ii) ලූක් සුවිශේෂයේ 9:3-6 හි සඳහන් පරිදි ශ්‍රාවකයින් දොළොස් දෙනා පිටත් කර යැවීමේ දී ක්‍රිස්තුස් වහන්සේ ඔවුන්ට දුන් උපදෙස් තුනක් ලියන්න.**

**(iii) දිව්‍ය පූජා යාගයට සහභාගී වීම තුළින් සාමයේ දූතයෙකු ලෙස ක්‍රිස්තු ඉගැන්වීම් සමාජයට බෙදා දෙන අයුරු කරුණු පහක් ගෙන හැර පාමින් විස්තර කරන්න.** *(ලකුණු 10 යි)*

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(6) (i)
1. රෝග සුව කිරීමේ වරය
2. යක්ෂයන් කෙරෙහි අධිකාරී බලය
3. දේව රාජ්‍ය ප්‍රකාශ කිරීමේ බලය (ලූක් 9:2) ***(ලකුණු 02 යි.)***

(ii)
- චාරිකාව සඳහා කිසිවක් නොගන්න.
- සැරයටියක්වත්, මල්ලක්වත්, රොටිවත්, මිල මුදල්වත්, කමිස දෙකක්වත් නොගන්න.
- යම් නිවසකට ඇතුළු වූ කළ එතැනින් පිටත්ව යන තුරු එහිම රැඳී සිටින්න.
- ජනතාව නොපිළිගන්නේ නම් ඔවුන්ට විරුද්ධව සාක්ෂියක් වන පිණිස ඔබේ පාද යට තිබෙන දූවිලි ගසා දමන්න. (ලූක් 9:3-6) ***(ලකුණු 03 යි.)***

(iii)
- දේව වචනයට සාවදානව සවන් දීම තුළින් එය එදිනෙදා ජීවිතයේ දී ක්‍රියාවට නැංවීම.
- තම මීසම පොදු වැඩ කටයුතුවලදී කාලය වැය කිරීමට නිර්ලෝභී වීම.
- තම මීසමේ වෙසෙන දුගී අසරණයින්ට මිල මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් ආධාර උපකාර කිරීමට සංවේදී වීම.
- නොයෙකුත් හේතූන් නිසා විරසක වී සිටින තමන්ගේ පන්තියේ, පාසලේ ළමුන් සොයා ගොස් ඔවුනට සාමූහික ජීවිතයේ වටිනාකම තේරුම් කර දීම.
- දිව්‍ය පූජාවේ අවසාන පැතුම වන "යන්න සාමය ගෙන යන්න" නැමැති පැතුම ඔබ ජීවත් වන ග්‍රාමයේ විවිධ ජන කොටස් තුළට ගෙන යාම.
- දිව්‍ය පූජාවේ දී රටේ සාමය උදෙසා යාච්ඤා කළා සේ පෞද්ගලිකව ද යාච්ඤා කිරීම, ජීවිතයේ ද එම සාමය අත්දැකීම තුළින් සමාජයේ අවිහිංසාවාදීව ජීවත් වීම.

***(මෙවැනි අදහස් ලියා ඇති අයුරු බලා ලකුණු 05ක් දෙන්න.)***

### පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

මෙම ප්‍රශ්නයත් තෝරාගෙන ඇත්තේ සමස්ත අපේක්ෂකයන්ගෙන් අඩක් පමණ (52%) වූ පිරිසකි. (i) හා (ii) කොටස් ක්‍රිස්තු ශ්‍රාවකයන් පිළිබඳව දැනුම මනින ලද ප්‍රශ්න වේ. පහසු ප්‍රශ්නයක් සේ පෙනුන ද ලබාගෙන ඇති ලකුණු එතරම් සාර්ථක වී නැත.

ලකුණු (8-10 අතර) එනම් 76%-100% අතර ලකුණු ලබා තිබුණේ 48% පමණ පිරිසකි. 19% පමණ පිරිසක් ලකුණු 6-7 අතර එනම් 51%-75% අතර සිටිති. ලකුණු 3-5 (26%-50%) අතර සිටින සිසුන් සංඛ්‍යාව 26% පමණ වේ. අවම මට්ටමේ එනම් 0%-25% (ලකුණු 0-2 අතර) සංඛ්‍යාව 8% පමණ වේ. (i) සහ (iii) කොටස් සඳහා 75% වඩා වැඩි පිරිසක් සාර්ථක පිළිතුරු සපයා තිබුණත් (ii) කොටස එතරම් සාර්ථක වී නොමැත. ලූක් සුවිශේෂයේ 9/3-6 යනුවෙන් බයිබල් පාඨාංකය ප්‍රශ්නයට අතුළත් වී ඇති නිසා උපදෙස් පිළිබඳ දැනුම තිබුණ ද පිළිතුරු සාර්ථකව ඉදිරිපත්ව නැත. එබැවින් ශුද්ධ බයිබල් පාඨාංක පිළිබඳව සිසුන්ට මග පෙන්වීමේ අවශ්‍යතාවය මතුවේ.

## 7 ප්‍රශ්නය

**7. පහත සඳහන් මාතෘකා දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.**

**(i) "මැරෙන්නට සිදු වුවත් මාගේ දේව ජීවිතය නැති කර ගන්නේ නැත." මරියා ගොරට්ටි තුමිය**

**(ii) මුල් කිතුනු සභාවේ ජීවිත පැවැත්ම**

**(iii) තේවාචාරි තුමාගේ කාර්ය භාරය**

**(iv) මව්පියන්ට සංග්‍රහ කරව (4 වන දේව පණත)**

**(v) පෙරමඟ සරසන්නා වූ ස්නාවක ජුවාමිතුමා** *(ලකුණු 05 × 2 = 10 යි.)*

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(7) (i) **"මැරෙන්නට සිදු වූවත් මාගේ දේව ජීවිතය නැති කර ගත්තේ නැත" මරියා ගොරට්ටි තුමිය**

- ඇයගේ වයස අවුරුදු 12 දී ඇගේ පියා මරණයට පත් විය. පසුව ඇය මව සමඟ බාල සහෝදරියන් රැක බලා ගෙන නිවසේ සම්පූර්ණ වගකීම භාර ගත් බව.
- දෙවියන් වහන්සේට ඇඩි සේ ආදරය කරමින් උන්වහන්සේ කෙරෙහි අචල විශ්වාසයකින් කටයුතු කළ බව. එසේම බාල සහෝදර සහෝදරියන්ට ඒ බව ඉගැන්වීම.
- මෙලෙස ඇය වැඩෙන විට අධ්‍යාත්මිකව මෙන්ම ශාරීරිකව ද වඩාත් ශක්තිමත් වූ බව.
- දිනක් ඇය තනිව ගෙදර සිටින විට එක් පව්වූ පුද්ගලයෙකුගේ අදහසට එකඟ නොවීම නිසාත් ඔහුට තදින් විරුද්ධ වීම නිසා ඔහු ඇයට මාරාන්තික තුවාල සිදු කිරීම.
- මරණයට පෙර මරියා තම මෑණියන්ට පැවසුවේ "අම්මේ මම පළමුවරට දිව්‍ය සත්ප්‍රසාදය ලැබූ දා ජේසුට දුන් පොරොන්දුව ඉටු කළා. මරණයට පත් වූවත් මා දේව ජීවිතය නැති කර ගත්තේ නැහැ" යනුවෙන් ප්‍රකාශ කරමින් ජීවිතයේ තම පිරිසිදුකම ආරක්ෂා කර ගනිමින් ඇය ස්වර්ගස්ථ වූවා ය.

(ii) **මුල් කිතුනු සභාවේ ජීවිත පැවැත්ම**

- ප්‍රේරිතවරුන් ඉගැන්වීමේ ද, සහභාගිකමේ ද, රොටි කැඩීමෙහි ද නිරතව කල් ගත කළහ.
- සියළු දෙනා තුළ ගෞරවාන්විත භියක් ඇති විය.
- ප්‍රේරිතවරුන් අතින් බොහෝ අරුම පුදුම දේ හා ලකුණු සිදුවිය.
- සැදැහැවතුන් සියලු දෙනා එක් වී සෑම දෙයක්ම පොදුවේ තබා ගත්හ.
- ඔවුහු තමන්ගේ ඉඩකඩම් හා දේපළ විකුණා එකිනෙකාගේ උවමනා හැටියට සියළුදෙනා අතර බෙදා ගත්හ.
- ඔවුහු දිනපතා නොකඩවා එක්සිත්ව දේව මාළිගාවේ රැස්වෙමින් ගෙයින් ගෙට යමින් රොටි කඩමින් ද, තම තමන් අතර ප්‍රීතියෙනුත්, ත්‍යාගවන්ත සිතිනුත් ආහාර බෙදා ගනිමින් ද, දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් හා සියල්ලන්ගේ ප්‍රසාදය ලබමින් ද කල් යැව්හ. (ක්‍රියා 2:42-47)

(iii) **තේවාචාරිතුමාගේ කාර්යභාරය**

- දේව වාක්‍ය කියවීම හා දේශනා කිරීම.
- ප්‍රසාද ස්නාපනය දානය කිරීම.
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බෙදා දීම.
- රදගුරුතුමාට හා පූජා ප්‍රසාදිතුමාට සහාය වීම.
- දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය දානය කිරීම.
- රෝගීන්ට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ රැගෙන යාම.
- විවිධ ද්‍රව්‍යයන් හා සැදැහැවතුන්ට බෙන්සාරු කිරීම.
- අවමංගල්‍ය පිළිවෙත් සිදු කිරීම.

(iv) **මව්පියන්ට සංග්‍රහ කරව (4 වන දේව පනත)**

- දෙමාපියන්ට ආදරය ගෞරවය පුද කිරීම.

- දෙමාපියන්ට කීකරු වීම, සවන් දීම.
- පාසල් සිසුවකු ලෙස අධ්‍යාපන කටයුතුවල උපරිම ශක්ති ප්‍රමාණයෙන් නිරත වී ජයග්‍රහණය ලබා දෙමාපියන්ගේ බලාපොරොත්තු ඉටු කිරීම ඔවුනට සතුටු කිරීම.
- දෙමාපියන්ට අවමන් නොවන සේ හැසිරීම.
- පවුල තුළ තමන්ට පැවරෙන වගකීම් හා යුතුකම් ඉටු කිරීම.
- දෙමාපියන් මහළුවියට පැමිණි විට ඔවුන් රැකබලා ගැනීම.

(v) **පෙරමඟ සරසන්නා වූ ස්නාවක ජුවාම් තුමා**
- ස්නාවක ජුවාම්තුමාගේ පියා සකරියස් වන අතර මව එළිසබෙත්තුමිය වේ.
- මහළු වියේ සිටි එළිසබෙත් පුතකු බිහිකරනා බව ග්‍රාබියෙල් දේව දූතයා සකරියස් වන එලිසබෙත්තුමියගේ ස්වාමි පුරුෂයාට දැන් වූ විට එය අවිශ්වාස කිරීම නිසා දඬුවමක් ලෙස දරුවා උපදින තෙක් සකරියස් ගොළු වීම.
- ස්නාවක ජුවාම් තුමාගේ උපත දේව අනුහසින් සිදු වූ බවට ප්‍රබලම සාක්ෂිය වනුයේ මහළු වියේ සිටි එළිසබෙත් තුමී තම පුතා වන ජුවාම් මෙලොවට බිහි කිරීමයි.
- පැරණි ගිවිසුම හා නව ගිවිසුම ඒකාබද්ධ කරන පුරුකක් ලෙස මෙතුමාව හඳුන්වනු ලැබේ.
- මෙතුමාගේ භූමිකාව වූයේ ජේසුස් වහන්සේගේ පෙර මඟ සූදානම් කිරීමේ කාර්යයයි.
- එතුමාගේ ආධ්‍යාත්මික ජීවිත රටාව දැඩි මර්ධන ක්‍රියාවල නිරත වෙමින කටුක ජීවිත රටාවක් අනුගමනය කළේය.
- එතුමා කණ්ඩායම් තුනකට දේශනා කළේය. එනම්,
  1. පොදු ජනතාව - "අඳන දෙකක් ඇති අය නැති අයට දෙත්වා."
  2. අය කැමියන්ට - "පමණට වඩා බදු අය නොකරන්න."
  3. හේවායින්ට - "කිසිවෙකුගෙන් කිසිවක් බලහත්කාරයෙන් නොගන්න."
- එකළ ජුවාම්තුමාට රජුගේ ආඥාව අනුව හිස ගසා දැමීමේ රාජ්‍ය නියෝගයට යටත් වීමෙන් ජීවිතය පරිත්‍යාගි කළේය.
- උන්වහන්සේ බැහැපත්කම මනාව පිළිඹිබු කළේ උන්වහන්සේ වදාළ "වඩින්නට සිටින තැනැත්න් වහන්සේගේ පාවහන් පටි මුදන්නට තමා නුසුදුස්සෙක් බව පිළි ගැනීම තුළිනි."

*(කෙටි සටහන් එකකට ලකුණු* **5 × 2 = 10** *යි.)*

## පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

ප්‍රශ්න පත්‍රයේ වෙනස් රටාවක ප්‍රශ්නයකි. දෙන ලද මාතෘකා පහකි. ඉන් දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලිවීම බලාපොරොත්තු වේ. මුළු ලකුණු දහය සමානව බෙදීයාමෙන් එක් කොටසකට ලකුණු පහකි. අනිවාර්ය ප්‍රශ්නය හැරුණු කොට වැඩිම අපේක්ෂක සංඛ්‍යාවක් තෝරාගත් ප්‍රශ්නයයි. එය සංඛ්‍යාත්මකව 75% පමණ වේ.

76%-100% අතර (8-10 අතර) ලකුණු ලබාගත් පිරිස 55%කි. 51-%75% අතර (6-7 අතර) පිරිස 15%ක් ද 26%-50% අතර (3-5 අතර) පිරිස 25%ක් ද 0%-25% අතර (0-2 අතර) පිරිස 7%ක් ද වශයෙන් ලකුණු ලබාගෙන ඇත.

සියලුම මාතෘකා තෝරාගෙන ඇත්තේ පෙළපොත ආශ්‍රයෙනි. (i), (iv), (v) මාතෘකා සඳහා 80%ට ආසන්න පිරිසක් සාර්ථකව පිළිතුරු සපයා ඇති අතර (ii), (iii) මාතෘකා සඳහා ලබාගෙන ඇත්තේ ඊට අඩු ප්‍රතිශතයකි. එසේම මෙය කෙටි සටහන් ලිවීමේ ප්‍රශ්නයක් බැවින් අනවශ්‍ය කරුණු විස්තර කිරීමකින් තොරව ප්‍රධාන කරුණු පමණක් කැටිකර ලියා දැක්වීමට සිසුන් හුරු කළ යුතුය.

# III කොටස

## 3.0 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

### 3.1. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

**පොදු උපදෙස් :**

- ★ ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද? කුමන ප්‍රශ්න අනිවාර්යය ද? කොපමණ කාලයක් ලැබේ ද? කොපමණ ලකුණු ලැබේ ද? යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය.
- ★ I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී වඩාත් නිවැරදි **එක්** පිළිතුරක් තෝරා ගත යුතුය. තවද පැහැදිලිව එක් කතිර ලකුණක් පමණක් යෙදිය යුතුය.
- ★ II පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක්ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.
- ★ නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතුය.
- ★ අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.
- ★ ප්‍රශ්න අංක හා අනු කොටස් නිවැරදිව ලිවිය යුතුය.
- ★ නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවල දී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතුය.
- ★ ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතුය.

3.2. **ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :-**

★ පෙළ පොත පමණක් නොව බාහිර පොත්පත් පරිශීලනය කිරීම කෙරෙහි ද සිසුවා යොමු කළ යුතු ය.

★ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයට පමණක් සීමා නොවී ගුරුවරයා ද බාහිර පොත්පත් කෙරෙහි සිය අවධානය යොමු කළ යුතු ය.

★ ශුද්ධ බයිබලය කියවීම කිතුනු ගුරුවරයාගේ මෙන්ම කිතුනු දරුවාගේ ද ජීවිතයේ අනිවාර්ය අංගයක් විය යුතු ය.

★ ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රධාන ඉගැන්වීම්, එනම් භාග්‍ය අට, උපමා හා ප්‍රාතිහාර්ය පිළිබඳව ගැඹුරු දැනුමක් ලබා ගැනීමට සුභාරංචි හතරක් සංදේශ පත්‍ර පිළිබඳ දැනුම තහවුරුවීමට සංදේශ පත්‍රත් ක්‍රියා පොතත් පරිශීලනයේ වැදගත්කම පිළිබඳව දරුවාට අවබෝධ කරවිය යුතු ය.

★ සිසුවා දහම් දැනුමට පමණක් සීමා නොකර, දහම ජීවිත අත්දැකීමක් බවට පත්කර ගැනීමට ද යොමු කළ යුතු ය.

★ සාරධර්මවලින් පිරිපුන් සමාජයක් බිහිකිරීම සඳහා පවුල තුළින් සමාජයට ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුමින් දරුවා පෝෂණය කළ යුතු ය.

★ ප්‍රසාද නිධාන හා දස පණත පිළිබඳව මතුපිටින් පමණක් නොව ගැඹුරින් අධ්‍යයනයට දරුවා යොමු කළ යුතු ය.

★ නිරන්තර යාච්ඤාව තුළින් දේව ආදරයට විවෘතවීමට දරුවා නිතර යොමු කළ යුතු ය.

★ විෂය දැනුම යාවත්කාලීන කරන වැඩමුළු, සම්මන්ත්‍රණ ආදියට ගුරු සිසු දෙපිරිසම සහභාගී වී ලබා ගන්නා දැනුමින් පෝෂණය වීමට උනන්දු විය යුතු ය.

**මනා පෞරුෂ සංවර්ධනයෙන් මෙන්ම සාරධර්ම වලින් ද පිරිපුන් දරු පිරිසක් සමාජයට දායාද කිරීමට නිරතුරුවම කැපවෙන, වැයවෙන කතෝලික දහම උගන්වන ගුරු භවතුන්ට එම කාර්ය නිසි අයුරින් ඉටු කිරීමට අවැසි දිරිය සවිය සමිඳුන් වෙතින් නිබඳව ලැබේවා! යි ප්‍රාර්ථනා කරමු.**